වාර්ෂික වාර්තාව

2022



ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

අංක 42, නවම් මාවත, කොළඹ 02

2023-12-20

ආයෝජන ප්‍රවර්ධන ගරු අමාත්‍ය
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
“සුහුරුපාය”, බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2022</u>

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2022වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිතුමාගේ පණිවිඩය**
- **ගිණුම් ප්‍රකාශන**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට- විශ්වාසි

ආචාර්ය කිංස්ලි බර්නාඩ්
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

පටුන

පිටුව

	සභාපතිතුමා ගේ පණිවිඩය	5
	හැඳින්වීම	6
	ආයතනික තොරතුරු - අධ්‍යක්ෂ මණ්ඩලය	7
	- ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය	8
1.	අපනයන කාර්යසාධනය 2022	10
1.	2022 ජනවාරි සිට දෙසැම්බර් කාලය තුල ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රගතිය	11
	1.1 සංශෝධිත අපනයන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම්	11
	1.2 2022 ජනවාරි- දෙසැම්බර් කාලය තුළ ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය	12
	1.3 2022 අපනයන පුරෝකථනය සහ 2022 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලය තුල අපනයන ඉපැයීම්	13
	1.4 2020 සිට 2022 දක්වා මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය	14
	1.5 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සේවා අපනයනය	14
	1.6 ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත 15	15
	1.7 නිදහස් වෙළෙඳ හවුල්කරුවන් වෙත අපනයනය	15
	1.8 ශ්‍රී ලංකාවේ අපනයන කලාප	16
2.	2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සිදු කරන ලද අපනයන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය	17
	2.1 වෙළඳපල සංවර්ධනය සහ සන්නාමකරණය	17
	2.1.1 වෙළඳ ප්‍රදර්ශන සහභාගීත්වය - භෞතික වෙළඳ ප්‍රදර්ශන	
	2.1.2 වෙළඳ ප්‍රදර්ශන සහභාගීත්වය - මාර්ගගත වෙළඳ ප්‍රදර්ශන	22
	2.1.3 B2B වැඩසටහන් සහ මාර්ගගත සම්මන්ත්‍රණ	22
	2.1.4 සන්නාම ප්‍රවර්ධනය	23
	2.1.5 **අපනයන වෙළඳපොල බුද්ධිමය තොරතුරු**	24
	2.1.6 **වෙනත් වෙළඳපල සංවර්ධන වැඩසටහන්**	24
	2.1.7 **ජෝර්දාන් වෙළඳපොලේ අඹ සඳහා ආනයනික තහනම ඉවත් කර ගැනීම**	25
	2.1.8 ජර්මානු ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) ජර්මනිය සමඟ සම්බන්ධව කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර අමුද්‍රව්‍ය නිෂ්පාදකයින්/ අපනයනකරුවන් සඳහා යුරෝපා සංගම් වෙළෙඳපොළ ප්‍රවේශ පහසුකම් සැලසීම	26
3.	නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්	27
4.	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන	27
5.	අපනයනකරුවන් සඳහා වන සහය වැඩසටහන්	28
6.	**අපනයනකරුවන් සඳහා පුහුණු වැඩසටහන්**	29
7.	**අපනයනය සම්බන්ධ ප්‍රකාශන**	31

පිටුව

8.	උපදේශන කමිටු	31
9.	ඊ-වෙළඳපොල - ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා මාර්ගගත ප්‍රවර්ධන	32
10	2023 ඉදිරි සැලසුම්	33
11	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා මධ්‍ය කාලීනව ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය [2022-2024]	37
12.	මූල්‍ය ප්‍රකාශන 2022	40
	2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය	41
	2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	42
	2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	43
	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	44
	පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති	45
	මූල්‍ය ප්‍රකාශන සටහන්	60
13.	විගණකාධිපති වාර්තාව - 2022	77

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) අපනයන ඉහළ නැංවීමට තුඩු දෙන ජාත්‍යන්තර වෙළඳ තරගකාරිත්වය ළඟා කර ගනිමින් තම ව්‍යාපාර වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස පවත්වා ගෙන යාමට ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට සහ විභව අපනයනකරුවන්ට අඛණ්ඩව සහාය වෙමින් සිටී.

අපනයන සංවර්ධන මණ්ඩලය ස්ථාපනය කිරීමෙහි පටන්ම රටෙහි අපනයන වැඩි දියුණු කිරීම, අපනයන විභවතා පුළුල් කිරීම, හා අපනයන වෙළඳපළ පුළුල් කිරීම සිය අරමුණ ලෙස මනාව හඳුනාගනිමින් ඒ සඳහා ඇප කැප වී ක්‍රියා කර තිබේ. ඒ තුල නව්‍යකරණයන් හඳුන්වාදීම හා ජාතියේ තිරසාර වර්ධනීය ආර්ථික ප්‍රගමනය තහවුරු කෙරෙන රැකියා අවස්ථා නිර්මාණය කිරීම ප්‍රමුඛ ලෙස කැපී පෙනේ. අපනයනය පෙරටුකොටගත් ආයෝජනයන් ධෛර්යමත් කරන්නාවූ වාතාවරණයක් නිර්මාණය කිරීම තුලින් අපනයනය දිරිමත් කිරීම හා අපනයන ප්‍රජාව වෙත සහයෝගය දැක්වීම උදෙසා අප වෙහෙස නොබලා කටයුතු කර ඇත්තෙමු.

ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා වෙසෙසින්ම ජාතික ආර්ථිකයේ කුඩා බව කෙරෙහි අවධානය යොමු කරමින් අපනයන වර්ධනය තිරසාර ලෙස පවත්වාගෙන යා යුතුය. අප වෙත ඇති තරඟකාරී වාසි සහගත අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම මෙහිදී අත්‍යාවශ්‍ය වේ. වර්ධනය වන ගෝලීයකරණය හා ගෝලීය සැපයුම්දාම සමග ඒකාබද්ධ වීම තුලින් ශ්‍රී ලංකාවේ සංසන්ධනාත්මක වාසි සහගත තත්වයන්, තරඟකාරී තත්වයන් බවට පත් කර ගත යුතුව තිබේ.

අපනයන අභිමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ නව ව්‍යාපාර සංවර්ධනය කිරීම, අගය එකතු කළ නිෂ්පාදන අංශවල දායකත්වය ඉහල නැන්වීම සහ විශේෂිත වෙළඳපල විවිධාංගීකරණය තුළින් අපනයන ආර්ථිකය වර්ධනය කරමින් ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් දියුණු රටක් බවට පත් කිරීම රජයේ ඉලක්කය වේ.

අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ වර්ධනය වන විභවයන් හඳුනා ගැනීම තුල මාර්ගෝපදේශකයෙකු හා ප්‍රවර්ධකයෙකු ලෙස ක්‍රියා කරමින් අපනයන වර්ධනය, ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම යන ප්‍රධාන කාර්යයන් ඉටු කරයි. වත්මන් අපනයනකරුවන්හට සිය අපනයන ඉහළ නැන්වීමට සහය වීම, නව අපනයන නිෂ්පාදන ප්‍රර්ධනය තුලින් රටේ වත්මන් අපනයන පසුතලය වෙනස් කිරීම, වෙළඳපල විවිධාංගීකරණය මගින් නව වෙළඳපල වෙත ප්‍රවිෂ්ඨ වීම, ධාරිතා සංවර්ධනය, සහ අපනයනය මූලික කර ගත් ආයෝජන ආකර්ශනය කර ගැනීම අපගේ ප්‍රධාන උපායමාර්ග වේ. මෙම නව ක්‍රියාමාර්ග ඉලක්කගත විදේශ විනිමය ඉපැයීම් සාක්ෂාත් කර ගැනීම වේගවත් කරයි.

අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ අමිල උත්සාහය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරමි. අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන දැඩි කැපවීම සහ මෙහෙය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙත ද ඇගයීම හිමි වේ.

ආචාර්ය කිංස්ලි ඔර්නාඩ්
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ දී පිහිටුවන ලද අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වේ.

දැක්ම, මෙහෙවර සහ කාර්යයන්

දැක්ම

''නව නිපැයුම් සහ සේවා සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම''

මෙහෙවර

''නවෝත්පාදන, ව්‍යවසායකත්ව හා ගෝලීය සැපයුම්දාම සමග ඒකාබද්ධ වීම තුළින් අපනයන තරගකාරිත්වය තහවුරු කිරීම''

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි කාර්යයන්

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස අපි පහත සඳහන් කාර්යයන් ඉටු කරන්නෙමු.

- පහසුකම් සපයන්නා - අපනයන සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය ලෙස සියලුම පාර්ශවකරුවන් සමඟ අපනයන සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම
- ප්‍රවර්ධකයා - ශ්‍රී ලංකාවේ භාණ්ඩ නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා නිෂ්පාදන, සැලසුම්, වෙළෙඳපොළ සහ අනෙකුත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- දැනුම සපයන්නා - අපනයන ව්‍යාපාරයේ සියලුම අංශ සම්බන්ධයෙන් අපනයනකරුවන් හට උපදේශන සහාය සේවා සහ තොරතුරු සැපයීම
- අධීක්ෂණය - අපනයන අංශයේ සියළු ක්‍රියාකාරීත්වයන් අධික්ෂණය කිරීම
- ප්‍රතිපත්ති උපදේශක - අපනයන සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව රජයට උපදෙස් දීම

ආයතනික තොරතුරු

අධ්‍යක්ෂක මණ්ඩලය - 2022

			සිට	දක්වා
1	සුරේෂ් ඩී. ද මැල් මහතා	සභාපති සහ ප්‍රධාන විධායක	11.12.2020	31.03.2023
2	මහාචාර්ය කේ.ලක්ෂ්මන් ජයරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	31.12.2019	31.12.2022
3	ආචාර්ය ජානක වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	16-12-2019	16-12-2022
4	කෞෂල්‍ය යහම්පත් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	16-12-2019	16-12-2022
5	චතුර වී. කබ්‌රාල් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	16-12-2019	16-12-2022
6	ලලන්ත වතුදුර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	16-12-2019	16-12-2022
7	රංජිත් ප්‍රියන්ත වීරසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	31-12-2019	31-12-2022
8	එන්.ජී. පන්ඩිතරත්න මහතා අතිරේක ලේකම් – කර්මාන්ත අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14-09-2020	31.01.2023
9	නිලක්ෂි ගුණසේකර මිය අතිරේක ලේකම් – කෘෂිකර්ම අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	Feb-2020	30.04.2023
10	කාන්ති ගුණවර්ධන මිය අතිරේක ලේකම් (සංවර්ධන) වෙළඳ අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	05-09-2020	31.12.2022
11	කේ.ඒ. විමලෙන්තිරරාජා මහතා අධ්‍යක්ෂ ජනරාල් වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේනතුව	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	02.03.2022	මේ දක්වා
12	ඒ.එච්.එස්. ෆරීදා මිය අධ්‍යක්ෂ ජනරාල් ධීවර සහ ජලජීවී අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14-09-2020	මේ දක්වා

			සිට	දක්වා
13	රේණුකා එම්. වීරකෝන් මිය වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් ආයෝජන මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	20.05.2022	මේ දක්වා
14	කේ.එන්. කුමාරී සෝමරත්න මිය අතිරේක ලේකම් (සංවර්ධන) වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14.12.2022	මේ දක්වා
15	සබරුල්ලා ඛාන් මහතා අතිරේක ලේකම් (ආර්ථික සබඳතා) විදේශ අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	25.01.2022	මේ දක්වා
16	අයි.එස්.එස්.ජේ. ඉලුක්පිටිය මහතා අතිරේක ලේකම් (සංවර්ධන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	24.01.2022	මේ දක්වා
17	සුනිල් ගලගම මහතා අතිරේක ලේකම් (සංවර්ධන) ආයෝජන ප්‍රර්ධන අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14.12.2022	මේ දක්වා

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2022

1.	**සභාපති සහ ප්‍රධාන විධායක**	**සුරේෂ් ඩී. ද මැල් මහතා**
2.	අධ්‍යක්ෂ ජනරාල්	චිත්‍රාංජලී දිසානායක මෙනවිය [2022.01.31 දක්වා - කොන්ත්‍රාත් පදනම මත]
	වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්	පී.වී.ඒ.එම්. බද්දේගමගේ මිය [2022.02.01 සිට]
3.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන)	එස්.ආර්.පී. ඉන්ද්‍රකීර්ති මහතා
4.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)	පී.වී.ඒ.එම්. බද්දේගමගේ මිය
5.	වැඩ බලන අධ්‍යක්ෂ - මුදල්	ඒ.පී. වික්‍රමසේකර මහතා [2022.03.06 දක්වා]
	අධ්‍යක්ෂ - මුදල්	කේ.ඩී. පෙරේරා මහතා [2022.03.07 සිට]
6.	වැඩ බලන අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ	යූ. අක්මීමන මහතා
7.	වැඩ බලන අධ්‍යක්ෂ - වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු	අචිනි වීරවර්ධන මිය [2022.04.01 සිට]
8.	වැඩ බලන අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ	ඩී.කේ.ඩී.එස්. සිසිල් මහතා
9.	අධ්‍යක්ෂ - කෘෂි අපනයන	ජේ.එස්. බදුගම මහතා [2022.03.03 සිට]
10.	අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන	සේපාලිකා ජයවර්ධන මිය
11.	අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති හා උපාය මාර්ගික සැලසුම්	ඕ.එම්.සී. කුමුදුනී මිය
12.	වැඩ බලන අධ්‍යක්ෂ – කාර්මික නිෂ්පාදන	මනෝජා දිසානායක මිය [2022.01.03 සිට]
13.	අධ්‍යක්ෂ - අපනයන සේවා	එල්.වයි.ආර්.අයි. කොඩිකාර මිය
14	අධ්‍යක්ෂ - අලෙවි සංවර්ධන	අනෝමා ප්‍රේමතිලක මිය
15.	අභ්‍යන්තර විගණක	නිල්මිණි රණසිංහ මිය
16	නීති නිලධාරීනී	ඩී.ටී. විජේරත්න මිය
17	විගණකවරු	විගණකාධිපති
18	බැංකුකරුවන්	ලංකා බැංකුව, සම්පත් බැංකුව ජාතික සංවර්ධන බැංකුව
19	ලියාපදිංචි කළ කාර්යාල	නො : 42, නවම් මාවත, කොළඹ 02.

- 1 -

අපනයන කාර්යසාධනය

2022

- 01 -


2022 ජනවාරි සිට දෙසැම්බර් කාලය තුල ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රගතිය

2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 15.0 දක්වා 3.94% කින් ඉහළ ගොස් ඇත. සමාලෝචිත කාල සීමාව තුළ ඇඟලුම් සහ රෙදිපිළි, ICT/ BPM, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ඉලෙක්ට්‍රොනික සහ ඉලෙක්ට්‍රොනික සංරචක, ආහාර සහ පාන වර්ග, මුහුදු ආහාර සහ විසිතුරු මත්ස්‍ය වැනි සියලුම ප්‍රධාන නිෂ්පාදන සහ සේවා අංශයන්හි අපනයන ඉපැයුම් වල වර්ධනය ඒ සඳහා දායක වී ඇත.


1.1 සංශෝධිත අපනයන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම්

2022 වර්ෂය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සංශෝධිත අපනයන ඉලක්කය ඇමරිකානු ඩොලර් බිලියන 16.1 ක් වූ අතර එය වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 14.1 ක් සහ අපනයන සේවා දායකත්වය ඩොලර් බිලියන 2.0 ක් ලෙස අපේක්ෂා කරන ලදි.

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සමස්ත අපනයන ඉපැයීම් සංශෝධිත ඉලක්කයෙන් 93.34 %ක සාක්ෂාත් කර ගැනීමක් ලෙස වාර්තා වූ අතර එය ඇමෙරිකානු එය ඩොලර් බිලියන 15.0 ක් ලෙස සටහන් විය. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉලක්ක සාක්ෂාත් පිළිවෙළින් 92.96 % සහ 96.03 % ලෙස වාර්තා විය.




1.2 2022 ජනවාරි- දෙසැම්බර් කාලය තුළ ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය



1.3 2022 අපනයන පුරෝකථනය සහ 2022 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලය තුල අපනයන ඉපැයීම්

අපනයන නිෂ්පාදන	අපනයන පුරෝකථනය 2022 (ඇ.ඩො.මී)	අපනයන ඉපැයීම් 2022 (ඇ.ඩො.මී)	අත්කර ගැනීමේ ප්‍රතිශතය
ඇඟලුම් සහ රෙදිපිළි	6,000	5,933.52	98.89
තේ	1,208	1,258.81	104.21
රබර් ආශ්‍රිත නිෂ්පාදන	1,285	1,018.38	79.25
පොල් ආශ්‍රිත නිෂ්පාදන	840	817.09	97.27
දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ	361	399.77	110.74
විදුලි සහ ඉලෙක්ට්‍රොනික සංරචක	450	483.28	107.40
කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන	514	370.30	72.04
සකස් කළ ආහාර පාන	512	426.39	83.28
මුහුදු ආහාර	316	269.02	85.13
විසිතුරු මාළු	25	21.74	86.96
එළවළු	58	27.80	111.20
පළතුරු	33	38.78	117.52
වෙනත් අපනයන බෝග	102	92.42	90.61
මල් සහ පත්‍ර	16	14.66	91.63
බෝට්ටු නිෂ්පාදන	50	17.40	34.80
ඛනිජ තෙල් නිෂ්පාදන	367	283.23	77.17
අනෙකුත් වෙළෙඳ අපනයන	1,995	1,633.81	81.90
සමස්ත වෙළඳ භාණ්ඩ අපනයන	**14,132**	**13,106.40**	**92.96**
තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණ සේවා (ICT/ BPM)	1,500	1,112	74.13
ඉදිකිරීම් සේවා	6	9	150.00
මූල්‍ය සේවා	75	92	122.67
ප්‍රවාහන සහ සැපයුම් සේවා	386	674	174.61
සමස්ත සේවා අපනයන	**1,967**	**1,887**	**96.03**
සමස්ත වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන	**16,099**	**14,993.40**	**93.34**

1.4 2020 සිට **2022** දක්වා මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය

1.5 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සේවා අපනයනය

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සේවා අපනයනය ඩොලර් බිලියන 1.9 ක් වූ අතර එය 2021 අනුරූප කාලපරිච්ඡේදයට වඩා 2.07 % ක අඩු වීමක් පෙන්නුම් කෙරේ. මෙහි දී මණ්ඩලය විසින් සලකා බලන ලද සේවා වනුයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා, ඉදිකිරීම් සේවා, මූල්‍ය සේවා සහ ප්‍රවාහන/ සැපයුම් සේවා යනා දි යයි.

1.6 ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත 15

2021 සහ 2022 වර්ෂයන් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත 15 වෙත සිදු කර ඇති අපනයන වටිනාකම සංසන්ධනාත්මකව පහත වගුවේ දක්වා ඇති අතර වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 72 % කට ආසන්න ප්‍රමාණයක් මෙම වෙළඳපල 15 වෙත යොමු වී ඇති බව පෙනේ. ඇමරිකා එක්සත් ජනපදයට තනි ගමනාන්තයක් ලෙස සමස්ත වෙළෙඳ අපනයනයෙන් 25.84% ක් සිදු කර ඇත.

	ගමනාන්තය	2021 (ඇ.ඩො.මි)	2022 (ඇ.ඩො.මි)	% වර්ධනය (21-22)	2022 අපනයන ප්‍රතිශතය
1	ඇමෙරිකා එක්සත් ජනපදය	3,068.80	3,319.85	8.18	25.33
2	එක්සත් රාජධානිය	933.72	966.04	3.46	7.37
3	ඉන්දියාව	815.11	854.88	4.88	6.52
4	ජර්මනිය	754.11	744.57	-1.27	5.68
5	ඉතාලිය	578.91	640.18	10.58	4.88
6	නෙදර්ලන්තය	425.72	428.27	0.60	3.27
7	කැනඩාව	312.85	361.44	15.53	2.76
8	එක්සත් අරාබි එමීර් රාජ්‍යය	282.84	345.82	22.27	2.64
9	බෙල්ජියම	334.32	307.68	-7.97	2.35
10	ප්‍රංශය	245.92	257.52	4.72	1.96
11	ඕස්ට්‍රේලියාව	254.30	254.40	0.04	1.94
12	චීනය	273.73	253.11	-7.53	1.93
13	ජපානය	223.77	226.30	1.13	1.73
14	බංග්ලාදේශය	221.60	217.54	-1.83	1.66
15	මෙක්සිකෝව	204.82	190.30	-7.09	1.45
	අනෙකුත්	3,568.08	3,738.50	4.78	28.52
	සමස්ත වෙළඳ අපනයන	**12,498.60**	**13,106.40**	**4.86**	**100.00**

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය

1.7 නිදහස් වෙළෙඳ හවුල්කරුවන් (FTA) වෙත අපනයනය

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නිදහස් වෙළඳ ගිවිසුම් ගත රටවලට සිදු කෙරුණු අපනයනය මුළු වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 7 % ක් විය. එය පසුගිය වසර හා සසඳන විට 3.0 % ක වැඩිවීමක් පෙන්නුම් කරන ලද අතර සමස්ත අපනයනය ඇමරිකානු ඩොලර් මිලියන 934.39 ක් විය.

2021 වසර හා සසඳන විට 2022 ඉන්දියාවට සිදු කළ අපනයනය ඇ.ඩො. මිලියන 854.88 දක්වා 4.9% කින් වැඩි වී ඇතත්, පකිස්තානයට සිදු කළ අපනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 79.51 දක්වා 13.5 % කින් අඩු වී ඇත.

2022 වසරේ සත්ත්ව ආහාර, පුවක්, වියන ලද රෙදි සහ ලී පල්ප් යනා දී නිෂ්පාදනයන් ගේ අපනයන වැඩි පිළිවෙලින් වීම11.75%, 45.24%, 46.33% සහ 18.06% ලෙස වාර්තා වන අතර එය ඉන්දියාවට සිදු කළ අපනයනයන්හි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

1.8 ශ්‍රී ලංකාවේ අපනයන කලාප

2021 සහ 2022 වර්ෂ තුළ කලාපීය වශයෙන් අපනයන දත්ත සංසන්දනාත්මකව පහත වගුවේ දැක්වේ. ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 48 % ක් ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වෙත සිදු කර ඇත.

කලාපය	2021 (ඇ.ඩො.මි)	2022 (ඇ.ඩො.මි)	% වර්ධනය (21-22)	2022 අපනයන ප්‍රතිශතය
එක්සත් ජනපදය	3,068.80	3,319.85	8.18	25.33
යුරෝපීය සංගමය (එක්සත් රාජධානිය හැර)	2,948.17	3,038.59	3.07	23.18
දකුණු ආසියාව	1,243.52	1,261.36	1.43	9.62
මැද පෙරදිග රටවල් (සයිප්‍රසය සහ ඊජිප්තුව හැර)	913.06	998.34	9.34	7.62
අප්‍රිකානු රටවල්	319.79	301.91	-5.59	2.30
ආසියාන් රටවල්	348.89	374.13	7.23	2.85
CIS රටවල්	253.54	248.85	-1.85	1.90
අනෙකුත්	3,402.83	3,563.37	4.72	27.19
සමස්ත වෙළඳ අපනයන	**12,498.60**	**13,106.40**	**4.86**	**100.00**

2022 වසර තුළ ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට කරන ලද මුළු අපනයනවලින් 78% ක් ජර්මනිය ඇ.ඩො. මි 744.57 ක වන අතර එය 2021 වසරට සාපේක්ෂව 1.27 % කින් අඩු වී ඇත. මේ ආකාරයෙන් ඉතාලිය ඇ.ඩො.මි 640.18 (10.58 % කින් වැඩි වී ඇත), නෙදර්ලන්තය ඇ.ඩො.මි 428.27 (0.60 % කින් වැඩි වී ඇත), බෙල්ජියම ඇ.ඩො.මි 307.68 කින්(7.97 % කින් අඩු වී ඇත) සහ ප්‍රංශය ඇ.ඩො.මි 257.52 (4.72 % කින් වැඩි විය) යන රට වලට සිදු කර ඇත.

02. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සිදු කරන ලද අපනයන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

අදාළ කාලසීමාව තුළ අපනයන නිෂ්පාදනය, භාණ්ඩ ප්‍රවාහනයට හා අඛණ්ඩව කර්මාන්තශාලා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අපනයනකරුවන්ට පහසුකම් සැලසීම, ඉන්ධන සහ විදුලිය සම්බන්ධ ගැටළු විසඳීම සඳහා අදාළ බලධාරීන් සමඟ සන්නිවේදනය කිරීම යනාදි ක්‍රියාවන් මඟින් දැනට සිටින අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ව්‍යාපාර දිගටම පවත්වා ගැනීමට පහසුකම් සැලසීමට අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. තවද අපනයන වැඩි කිරීමට සහ නව අපනයනකරුවන් සංවර්ධනය සඳහා අයවැය යෝජනා ඇතුළු සංවර්ධන වැඩසටහන් රැසක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇත.

අය-වැය ප්‍රතිපාදන ලැබීම් සීමාවන් හේතුවෙන්, අන්තර්ජාතික දායක නියෝජිත ආයතනවල සහය ඇතිව සහ අපනයනකරුවන්ගේ දායකත්වයෙන් අපනයන ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 වැනි දින අංක 3/2022 දරන රාජ්‍ය වියදම් සීමා කිරීම සඳහා වන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව, පෙර සැලසුම් කරන ලද සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2.1 වෙළඳපල සංවර්ධනය සහ සන්නාමකරණය

2.1.1. වෙළඳ ප්‍රදර්ශන සහභාගීත්වය - භෞතික වෙළඳ ප්‍රදර්ශන

ඩුබායි හි ගල්ෆ් ෆුඩ් ප්‍රදර්ශනය 2022

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 13 සිට 17 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේදී පවත්වන ලද GULFOOD 2022 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලදී. GULFOOD යනු රටවල් 200කින් පමණ ප්‍රදර්ශකයින් 5000ක් සහ 100,000 කට අධික නරඹන්නන් සහභාගි වන ලොව විශාලතම ආහාර සහ පාන වර්ග ප්‍රදර්ශන වලින් එකකි.

ශ්‍රී ලංකාවේ ආහාර පාන නිෂ්පාදන ප්‍රධාන වශයෙන් මැද පෙරදිග, අප්‍රිකාව සහ දකුණු ආසියාව (MEASA) කලාපයට ප්‍රදර්ශනය සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් මෙම GULFOOD 2022 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලදි. ආහාර පාන, පොල්, කුළුබඩු, එළවලු හා පළතුරු නිෂ්පාදන ප්‍රදර්ශනය කරමින් සමාගම් 19ක් මෙම අවස්ථාවට සහභාගී විය. සහභාගීත්වයේ ප්‍රතිඵලයක් ලෙස, ඇමරිකානු ඩොලර් මිලියන 10.40 ක ස්ථීර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර එයින් ඩොලර් මිලියන 7.90 ක් වටිනා වෙළෙඳ ඇණවුම් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ඩොලර් මිලියන 6.30 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

ලක්සම්බර්ග් ICT Spring ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය අඛණ්ඩව දෙවන වරටත්, බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ජුනි 30 සිට ජූලි 1 දක්වා ලක්සම්බර්ග් හිදී පැවැත්වුණු ICT Spring - ලක්සම්බර්ග් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලාංකිය වෙළෙඳ මණ්ඩපයක් සංවිධානය කරන ලදි. මෙම වෙළඳ ප්‍රදර්ශනයට සහ ව්‍යාපාරික රැස්වීම් සඳහා ශ්‍රී ලාංකික සමාගම් පහක් සහභාගී විය. වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී කරවීමට ප්‍රථම වෙළඳපල පිළිබඳ දැනුවත් කිරීම සහ ප්‍රදර්ශනය සඳහා සූදානම් කිරීමේ කටයුතු සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහභාගීවන්නන් සඳහා ලක්සම්බර්ග් හි තාක්ෂණික ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ බ්‍රසල්ස් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ඔවුන්ට මග පෙන්වීම සඳහා සැසි සංවිධානය කරන ලදී.

වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන් සඳහා ෆ්‍රැන්ක්ෆර්ට්, ලක්සම්බර්ග් සහ බර්ලින් හි ව්‍යාපාරික රැස්වීම් සහ ව්‍යාපාරික ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී.

මෙම අවස්ථාවට සහභාගී වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමාගම් විසින් ඒකාබද්ධ/හවුල් ව්‍යාපාර දෙකක් ස්ථාපනය කරන ලදී. එක් සමාගමක් එක්සත් රාජධානියේ කාර්යාලයක් පිහිටුවීමට කටයුතු කරමින් සිටින අතර අනෙක් සමාගම Frankfort හි මෙහෙයුම් කාර්යාලයක් පිහිටුවීම සඳහා Frankfort Trade and Investment Authority (FRM) සමඟ සන්නිවේදනය කරයි. මීට අමතරව, එක් සමාගමක් VC අරමුදල් සහ සමාගම් සංස්ථාගත කිරීම සඳහා නීතිමය සහාය ඇතිව ලක්සම්බර්ග් හි කාර්යාලයක් පිහිටුවීමට ලක්සම්බර්ග් හි Parva Consulting ආයතනය සමඟ සාකච්ඡාවක යෙදී සිටින අතර එම සමාගම ලක්සම්බර්ග් හි සමාගම නියෝජනය කිරීමට හවුල්කරුවෙකු තෝරාගෙන ඇත.

සී ෆුඩ් එක්ස්පෝ ග්ලෝබල් 2022

ගෝලීය මුහුදු ආහාර කර්මාන්තයේ ප්‍රමුඛතම වෙළඳ ප්‍රදර්ශනයක් ලෙස හඳුනාගෙන ඇති සී ෆුඩ් එක්ස්පෝ ග්ලෝබල් වෙළඳ ප්‍රදර්ශනය, 2022 අප්‍රේල් 26 සිට 28 දක්වා ස්පාඤ්ඤයේ බාර්සිලෝනා හිදී පැවැත්විණි. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහිදී ශ්‍රී ලාංකික අපනයනකරුවන් 4 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපයක් සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපයට නරඹන්නන් 450 කට වැඩි පිරිසක් පැමිණ සිටි අතර සාධනීය විමසීම් 63ක් ලැබිණි. පෝලන්තය සඳහා ඇමෙරිකානු ඩොලර් 150,000ක්, ප්‍රංශය සඳහා ඇමෙරිකානු ඩොලර් 100,000ක් සහ දකුණු අප්‍රිකාව සඳහා ඇමෙරිකානු ඩොලර් 37,500ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී. සහභාගි වූ අපනයනකරුවන්ට පෝලන්තය, දකුණු අප්‍රිකාව සහ නවසීලන්තය වැනි නව වෙලඳපොලවල් වෙත ප්‍රවේශ වීමට අවස්ථාව ලැබිණ. තවද, මෙහිදී මත්ස්‍ය සැකසුම් සහ මත්ස්‍ය සැකසුම් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා ගැනීමට ද හැකි විය.

ඉන්දියා ෆැෂන් ටෙක්ස් 2022

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2022 මාර්තු 29-31 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැති ඉන්දියා ෆැෂන් ටෙක්ස් 2022 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ ඇඟලුම් සහ අත්යන්ත්‍ර නිෂ්පාදන සමාගම් 8 ක් සඳහා නිරීක්ෂණ සංචාරයක් සංවිධානය කරන ලදී.

ඉන්දියා ෆැෂන් ටෙක්ස් යනු අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්තය සඳහා නූල් සහ රෙදි සඳහා මූලාශ්‍රයක් වන අතර එහි දී ශ්‍රී ලාංකේය අත්යන්ත්‍ර රෙදිපිළි සමාගම්වලට ඉන්දියාවෙන් සිය කර්මාන්තයට අවශ්‍ය නූල් ලබා ගැනීම සඳහා විශ්වාසදායක සැපයුම්කරුවන් හමුවීමට අවස්ථාව හිමි විය.

Biofach 2022

ශ්‍රී ලංකාව සහතික කළ කාබනික නිෂ්පාදන පෙළක් අපනයනය කරන අතර, දශක දෙකකට වැඩි කාලයක් ජාත්‍යන්තර කාබනික ආහාර වෙළඳපොළට උසස් තත්ත්වයේ විශ්වාසවන්ත සැපයුම්කරුවෙකු ලෙස එහි විශිෂ්ට හැකියාවක් පෙන්නුම් කරමින් ලොව පුරා පාරිභෝගිකයින් අතර විශිෂ්ට කීර්තියක් පවත්වා ගෙන යයි.

කාබනික නිෂ්පාදන කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වන ප්‍රයත්නයන් අඛණ්ඩව කරගෙන යමින්, අපනයන සංවර්ධන මණ්ඩලය, යුරෝපා සංගමය සහ ජර්මානු ආයතන වන ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන සඳහා වන ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ), GIZ සහ ජර්මානු ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) විසින් ‘‘කාබනික ආහාර සහ ස්වභාවික රූපලාවන්‍ය’’ සඳහා ජර්මනියේ නියුරම්බර්ග් හි 2022 ජූලි 26 සිට 29 දක්වා පැවැත් වූ ලොව ප්‍රමුඛතම වෙළඳ ප්‍රදර්ශනය වන BIOFACH 2022 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික සමාගම් 15 ක කගේ සහභාගීත්වය සංවිධානය කරන ලදි. තෝරාගත් සමාගම් වෙළඳ ප්‍රදර්ශනයට පෙර තම ජාලගතවීමේ සහ අලෙවිකරණ කුසලතාවයන් දියුණු කර ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජර්මානු ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) විසින් පවත්නව ලද පුහුණුවීම් සහ වැඩමුළු මාලාවකට සහභාගී විය. ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකික සමාගම් විසින් ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපයේ දී අගය එකතු කළ පොල් නිෂ්පාදන, ශ්‍රී ලාංකික කුළුබඩු සහ කරවල ආදී විවිධ කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. මෙහි දී ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට යුරෝපීය වෙළෙඳපොළ තුළ නව ගැනුම්කරුවන් සහ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමට සහ වෙළඳ/වෘත්තීය සබඳතා වර්ධනය කිරීමට මෙන්ම ඔවුන්ගේ නිෂ්පාදන සහ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සහ ඉස්මතු කිරීමට ජාලගතවීමේ මධ්‍යස්ථානයක් නිර්මාණය විය.

සහභාගී වූ සමාගම්වලට ඔවුන්ගේ නිෂ්පාදන, හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සහ ඉස්මතු කිරීමට, සම්බන්ධතා ඇති කර ගැනීමට සහ යුරෝපයේ විභව ගැනුම්කරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ වෘත්තීය සබඳතා වර්ධනය කර ගැනීමට මෙම වෙළඳ මණ්ඩපය බවට පත් ජාල

කේන්ද්‍රස්ථානයක් විය. සම-ප්‍රදර්ශකයින් සමඟ ව්‍යාපාරික රැස්වීම් 300කට වඩා පැවැත්වුණු අතර යුරෝපීය ගැනුම්කරුවන්ගෙන් US$ 385,000 ක් පමණ වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ක්‍රියාවට නැංවිණ.

එක්සත් ජනපදයේ ලාස් වේගාස් හි " Magic sourcing Fair"

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ ඇමරිකා එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2022 අගෝස්තු 7 සිට 10 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රමුඛතම ඇඟලුම් වෙළෙඳ ප්‍රදර්ශනය ලෙස සැලකෙන " Magic sourcing Fair" හි ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපයක් සංවිධානය කරන ලදී.

එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නීති සංවර්ධන වැඩසටහන (CLDP) මගින් ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපය ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය දැක්වූ අතර ඒ සඳහා ශ්‍රී ලාංකීය ඇඟලුම් සමාගම් 9 ක් සහභාගී විය. එහිදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තොරතුරු කුටියක් පවත්වා ගෙන යන ලදී.

" Magic sourcing Fair" නව මුහුණුවරකින් යුත් පරිසරයක් තුළ ශ්‍රී ලංකා ඇඟලුම් අංශය සහභාගී වූ පළමු ජාත්‍යන්තර ප්‍රදර්ශනයයි. ආරම්භක ව්‍යාපාර හා අන්තර්ජාල පාරිභෝගිකයින් රාශියක් තම ප්‍රදර්ශන කුටි වෙත ආකර්ශනය කර ගැනීමට හැකි වූ බැවින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මෙම ප්‍රදර්ශනය ඉතා සාර්ථක එකක් වූ බව ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයන සමාගම්වල අදහස විය.

ප්‍රර්ශණය සඳහා සහභාගී වූ සමාගම්වලට ඇමෙරිකානු ඩොලර් 50,000 ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබී ඇති අතර මීට අමතරව පැවැත්වෙන ව්‍යාපාරික සාකච්ඡා මගින් තවත් වෙළෙඳ අවස්ථා ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.





" Magic sourcing Fair" හි ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2022 ඔක්තෝම්බර් 15 සිට 19 දක්වා පැරිසියේ පැවති SIAL Paris – 2022 ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලාංකීය ආහාර සහ පාන අපනයන සමාගම් දහනවයක් (19) සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපය සංවිධානය කරන ලදි.

මීට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හතරකට ජර්මනියේ ආනයන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ සහාය ඇතිව මාර්ගෝපදේශන අධ්‍යයන චාරිකාවකට සහභාගී වීමටත් ඔවුන් සංවිධානය කළ IPD මණ්ඩපය තුළ ප්‍රදර්ශනයට සහභාගි වීමටත් අවස්ථාව හිමි විය.

සහභාගි වූ සමාගම්වලට ඇ.ඩො. මිලියන 11ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබී ඇති අතර ඇ.ඩො. මිලියන 22ක් වටිනා වෙළෙඳ ඇණවුම් සාකච්ඡා වෙමින් පවතී. ඇමරිකානු ඩොලර් 954,900 ක් වටිනා ඇණවුම් 2022 දී ක්‍රියාත්මක කරන ලදී.

Grocery Innovations Canada (GIC) වෙළඳ ප්‍රදර්ශනය 2022

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2022 ඔක්තෝබර් 25 සිට 26 දක්වා කැනඩාවේ ටොරොන්ටෝ හි පැවති Grocery Innovations Canada (GIC) වෙළඳ ප්‍රදර්ශනය කුළුබඩු, පොල් මද නිෂ්පාදන, සැකසූ ආහාර, සැකසූ පලතුරු සහ තල් වයින් අපනයනය කරන ශ්‍රී ලාංකික සමාගම් පහකගේ (5) සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදි.
මෙහි දී ඇ.ඩො. 85,270 ක ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබී ඇති අතර ඇ.ඩො. 210,635 ක වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

වියට්නාම් එක්ස්පෝ 2022

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව සංවිධානය කරන ලද විසි වන වියට්නාම් එක්ස්පෝ ප්‍රදර්ශනය, 2022 දෙසැම්බර් 1 සිට 3 දක්වා හෝ චි මිං නගරයේ Sai Gon Exhibition & Convention Center (SECC) හි පැවති අතර ඒ සඳහා ප්‍රථම වරට ශ්‍රී ලාංකික අපනයනකරුවන් 5 දෙනෙකු ගේ සහභාගීත්වය සංවිධානය කරන ලදී.

වියට්නාම් එක්ස්පෝ මගින් යන්ත්‍රෝපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපකරණ, දෘඩාංග සහ අත් මෙවලම්, ආහාර සහ ප්‍රොපැක්, උද්‍යාන සහ භූ අලංකරණය වැනි විවිධ නිෂ්පාදන අංශ සඳහා රටවල් වලට ඔවුන්ගේ අද්විතීය නිෂ්පාදනයන් ප්‍රදර්ශනය කිරීමට විශිෂ්ට අවස්ථාවක් ලබා දෙන ලදි. විශාලතම වෙළඳ ප්‍රදර්ශනය වන වියට්නාම් එක්ස්පෝ, ආසන්න වශයෙන් ප්‍රදර්ශන කුටි 550 කින් සමන්විත වූ අතර, රටවල් 20 කින් සහ නරඹන්නන් 13,000 ක් නියෝජනය කරමින් පැවැත්විය.

ශ්‍රී ලාංකීය සමාගම් වලට වෙළෙඳ විමසීම් 100 කට වඩා ලැබී ඇති අතර උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමඟ ව්‍යාපාරික රැස්වීම් විශාල ප්‍රමාණයක් පැවැත්විය. එමෙන්ම ඔවුන්හට ප්‍රධාන වශයෙන් විදුලි කේබල්, කාර්මික විද්‍යුත් නිෂ්පාදන, කුරුඳු නිෂ්පාදන සහ විවිධ තේ වර්ග වැනි නිෂ්පාදන මිලදී ගන්නන් 20කට අධික සංඛ්‍යාවක් සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාව හිමි විය.

2.1.2 වෙළඳ ප්‍රදර්ශන සහභාගීත්වය - මාර්ගගත වෙළඳ ප්‍රදර්ශන

5 වන චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනයේ (CIIE) මාර්ගගත ශ්‍රී ලංකා ජාතික මණ්ඩපය - 2022

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් **මාර්ගගත ක්‍රමය ඔස්සේ** CIIE 2022 හි **ශ්‍රී ලංකා** ප්‍රවර්ධන කලාපයේදී වෙළෙඳ මණ්ඩපයක් සංවිධානය කරන ලදී. මාර්ගගතව සංවිධානය කරන ලද ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) යන ආයතනවල සහාය ඇතිව සංවර්ධනය කරන ලදී. CIIE වෙබ් අඩවියේ ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සත්කාරකත්වය ලබා දෙන ලදී.

අනෙකුත් මාර්ගගත ප්‍රදර්ශන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ‘‘Agriteq - කටාර්’’, කොරියානු ආනයන වෙළඳ ප්‍රදර්ශනය, සහ චීනයේ කැන්ටන් ප්‍රදර්ශනය වැනි මාර්ගගත වෙළඳ ප්‍රදර්ශන 03 කදී අපනයන සමාගම්වල සහභාගීත්වය සම්බන්ධීකරණය කර ඇත. සහභාගී වූ සමාගම්වලට මේ තුළින් ගැනුම්කරුවන් හමුවීමේ අවස්ථාවන් හිමි වූ අතර සාකච්ඡා සඳහා ද ගැනුම්කරුවන් සමඟ ධනාත්මක සම්බන්ධතා ස්ථාපිත වී ඇත.

ඊට අමතරව, ‘‘කොකනට් වොන්ඩර්’’ නම් ප්‍රවර්ධන වැඩසටහනක් බ්‍රසල්ස් හි බෙල්ජියම් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. සමාගම් 7 ක් පමණ ඔවුන්ගේ නිෂ්පාදිත සාම්පල බ්‍රසල්ස් හි තානාපතිවරයාගේ නිල නිවසේ ප්‍රදර්ශනය කිරීම සඳහා යවන ලද අතර ශ්‍රී ලාංකික පොල් අපනයනකරුවන් 15 කට වැඩි පිරිසක් මාර්ගගත ක්‍රමය හරහා එයට සහභාගී වූහ.

2.1.3 B2B වැඩසටහන් සහ මාර්ගගත සම්මන්ත්‍රණ

වෙළඳපළ සම්බන්ධතා ඇති කිරීම සහ ක්ෂණික ඇණවුම් ලබා ගැනීමේ අරමුණින් ලැබුණු සෘජු විමසීම් මත පදනම්ව ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහාය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් භෞතික සහ මාර්ගගත B2B රැස්වීම් 41 ක් (මුහුදු ආහාර -03, සැකසූ ආහාර - 12, රබර් -01, ඇඟලුම් -01, මැණික් සහ ස්වර්ණාභරණ -01, සැහැල්ලු ඉංජිනේරු - 01, තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ - 01, විදුලි හා ඉලෙක්ට්‍රොනික සංරචක - 05, ලොජිස්ටික්ස් - 04, ඉදිකිරීම් - 04, බහු නිෂ්පාදන - 08), ව්‍යාපාරික සංසද 02 ක්, එක් වෙළඳ නියෝජිත කණ්ඩායමක් සංවිධානය කරන ලදී.

අපනයන වෙළෙඳපොළේ නව ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීම සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ 11ක් සහ දැනුවත් කිරීමේ සැසි 01ක් පවත්වන ලදී.

එම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල පහත දක්වා ඇත;

- ජපාන විදුලි හා ඉලෙක්ට්‍රොනික සංරචක (EEC) සමාගමක් සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 1 ක ව්‍යාපාරික සම්බන්ධතාවක් ස්ථාපිත කර ඇත.
- ඇමරිකානු ඩොලර් 25,000ක් වටිනා ඇඟලුම් සඳහා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබිණ.
- පකිස්තානයට යවන ලද වෙළෙඳ දූත කණ්ඩායමේ ප්‍රතිඵලයක් ලෙස තේ, රබර් සහ සෙවිලි තහඩු සඳහා ඇමරිකානු ඩොලර් 200,000/- වටිනාකමින් යුත් වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.
- නිල් පිහිනුම් කකුළුවා, මඩ කකුළුවා, මුහුදු කූඩැල්ලා සහ බෙල්ලන් අපනයනය කරන ශ්‍රී ලාංකික අපනයනකරුවන් 07 දෙනෙකු එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙළඳපොළට හඳුන්වා දෙන ලදී. සමාගම් 03 ක් මිල ගණන් සාකච්ඡා කරමින් සිටී.
- තුර්කියට මුහුදු ආහාර අපනයනකරුවන් 03 දෙනෙකු සහ ප්‍රංශයට මුහුදු ආහාර අපනයනකරුවන් 04 දෙනෙකු හඳුන්වා දීම. මිල ගණන් පිළිබඳ සමාගම් 02 ක් සාකච්ඡා කරමින් සිටී.
- ජර්මානු ගැනුම්කරුවෙකු ආහාර හා බීම වර්ග සමාගම් 02 ක (Stassen, Green Field Bio Plantation) සංචාරය කර තේ සහ ශාකසාර නිෂ්පාදන සඳහා වෙළෙඳ ඇණවුම් ලබා දී ඇත.
- Lion Brewery ආයතනය මද්‍යසාර පාන අපනයනය කිරීම සඳහා දකුණු අප්‍රිකානු සමාගමක් සමඟ සම්බන්ධ වී සිටී.
- ජෝර්දාන් ගැනුම්කරුවෙකු කෝපි සඳහා එක් සමාගමක් සඳහා වෙළෙඳ ඇණවුමක් ලබා දී ඇත.
- කොරියානු ගැනුම්කරුවෙකු තේ සමාගම් 02ක් සඳහා වෙළෙඳ ඇණවුම් ලබා දී ඇත.
- "Amante" සන්නාමය දෝහා කටාර්හි ගැනුම්කරුවෙකුට හඳුන්වා දෙන ලදී.

2.1.4. සන්නාම ප්‍රවර්ධනය

- ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රය සඳහා අනන්‍ය සන්නාමයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාතික අපනයන සන්නාමයක් සහ ප්‍රවර්ධන සැලැස්මක් සකස් කරන ලදි. මෙම වැඩසටහන යටතේ ප්‍රධාන අපනයන ක්ෂේත්‍ර 11ක් ප්‍රවර්ධනය කිරීමටත්, අදාළ රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සමඟ සාකච්ඡා කර සන්නාම ප්‍රවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය.
- 2022 පෙබරවාරි 2 වන දින යුරෝපා සංගමය (EU) විසින් ලංකා කුරුඳු සඳහා ආරක්ෂිත භූගෝලීය දර්ශකය (PGI) සහතිකය පිරිනමන ලදී. සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවය 2022 අප්‍රේල් 27 වන දින ශ්‍රී ලංකාවේ යුරෝපා සංගම් නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියාගේ සහයෝගයෙන් කොළඹදී පැවැත්විණි. 2022 ජූලි මාසයේදී ජර්මනියේ පැවති Bio-Fach 2022 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේදී ලංකා කුරුඳු සඳහා ආරක්ෂිත භූගෝලීය දර්ශකය එළිදක්වන ලදී. මේ මගින් කුරුඳු අද්විතීය තනි සම්භවයක් ඇති නිෂ්පාදනයක් ලෙස ප්‍රවර්ධනය කිරීමටත් කුරුඳු අපනයනය සඳහා ඉහළ වටිනාකමක් ලබා ගැනීමටත් අපනයන සංවර්ධන මණ්ඩලය අදහස් කරයි.
- ලංකා කුරුඳු භූගෝලීය දර්ශකය සඳහා පාලන යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාව යටතේ මාතර, ගාල්ල, හම්බන්තොට, කෑගල්ල, මහනුවර, නුවරඑළිය සහ මාතලේ

දිස්ත්‍රික්කවල භූගෝලීය දර්ශක පාලන සැලැස්ම පිළිබඳ පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරන ලද අතර නිලධාරීන් 370 දෙනෙකු පුහුණු කරන ලදී. මීට අමතරව රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්කවල ගොවි පුහුණු වැඩසටහනක් ආරම්භ කර ගොවීන් 100ක් පුහුණු කරන ලදී.

- ආරක්ෂිත භූගෝලීය දර්ශක සංගමය පිහිටුවා නව සංගමයක් ලෙස ලියාපදිංචි කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාව යටතේ ගොවීන් සහ නිෂ්පාදකයින් සඳහා භූගෝලීය දර්ශක පාලන සැලැස්ම පිළිබඳ මාර්ගෝපදේශ පොත එළිදක්වන ලදී.

2.1.5. අපනයන වෙළඳපල බුද්ධිමය තොරතුරු

- අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආවරණය වන පරිදි වෙළඳපළ පර්යේෂණ වාර්තා දහයක් (10) සම්පූර්ණ කර අදාළ ක්ෂේත්‍රයන් වෙත බෙදා හරින ලදී (ජාත්‍යන්තර වෙළඳපොළේ නව්‍ය නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම, දකුණු අප්‍රිකානු ආහාර වෙළඳපොළ, ගෝලීය කුකුළු කර්මාන්තය, රුසියාව සඳහා කෘෂිකර්ම අපනයන ප්‍රවර්ධනය, දකුණු ඇමරිකාව සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපළ, ප්‍රංශ වෙළඳපළ සඳහා විසිතුරු මාළු, නැගෙනහිර යුරෝපයේ වෙළඳපළ සඳහා මල් වගාව, කොරියානු වෙළඳපළ සහ නැගෙනහිර යුරෝපයේ වෙළඳපළ සඳහා ආයුර්වේද සහ ඔසු නිෂ්පාදන සහ ආලේපන, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සඳහා මුහුදු ආහාර සහ කැනඩාව සඳහා සත්ත්ව ආහාර වලින් තොර නිෂ්පාදන, කාබනික සහ සෞඛ්‍ය නිෂ්පාදන, ශීත කළ ආහාර, කුළුබඩු සහ සාන්ද්‍රණය, පාම් මත පදනම් වූ රසකාරක, සහ පාම් වයින්)
- අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන සඳහා වන මූලික වෙළඳපළ අධ්‍යයනය EURO Monitor International ආයතනය සමඟින් එක්ව සම්පූර්ණ කරන ලදී.
- මෝටර් රථ කර්මාන්තය සහ සමුද්‍ර සහ අක්වෙරළ සේවා අංශය පිළිබඳ වෙළඳපළ පර්යේෂණ වාර්තා සකස් කරන ලදී.
- විදුලි හා ඉලෙක්ට්‍රොනික සංරචක අංශය සඳහා ඩිජිටල් අලෙවිකරණ අන්තර්ගතය සංවර්ධනය කර අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කරන ලදී.

2.1.6. වෙනත් වෙළඳපල සංවර්ධන වැඩසටහන්

වියට්නාමයේ සිට 45 දෙනෙකුගෙන් යුත් ආගමික දූත පිරිසකට ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (විශ්වවිද්‍යාල 03) නැරඹීමට පහසුකම් සලසන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබීමට කැමති වියට්නාම සිසුන්ට සහාය වීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වියට්නාම පහසුකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාල බලධාරීන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී. මෙම වැඩසටහන බෞද්ධ අධ්‍යාපන සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සහ වියට්නාමයේ බෞද්ධ විශ්වවිද්‍යාල නියෝජිතයන් සඳහා 2021 වසරේ හැනොයි හි අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකා දූත මෙහෙවර සමඟ සහයෝගයෙන් හා නේපාල කර්මාන්ත සංගම්වලින් ලද ධනාත්මක ප්‍රතිචාර මත පදනම්ව ජාත්‍යන්තර සෞඛ්‍ය විද්‍යා ආයතනයට (IIHS) නේපාලයේ සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය සඳහා යෝජනා සාකච්ඡා කිරීමට සහය ලබා දෙන ලදී. මෙම හවුල් ව්‍යාපාරවලට ඇතුළත් වීමේ හැකියාව සොයා බැලීම සඳහා සංවිධාන කිහිපයක් (නේපාලයේ අධ්‍යාපන උපදේශක සංගමය සහ නේපාල හෙද කවුන්සිලය) හමුවීමට ජාත්‍යන්තර සෞඛ්‍ය විද්‍යා ආයතනයට නේපාලයට සංචාරය කිරීමට නියමිතය.

ජාත්‍යන්තර සෞඛ්‍ය විද්‍යා ආයතනය (IIHS) නේපාලයේ සංචාරය කිරීමට පහසුකම් සලසා ඇති අතර නේපාලයේ ශ්‍රී ලාංකීය සෞඛ්‍ය සේවා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගී සහ හවුල්කාරිත්වයන්ට එළඹීමට නේපාල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවිධාන කිහිපයක් සමඟ ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කරන ලදී.

අයවැය සීමාවන් හේතුවෙන් රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල සිසුන් යොදා ගනිමින් "Study in Sri Lanka වෙබ් අඩවිය" සහ "කර්මාන්ත සමීක්ෂණය" ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

විදේශීය සිසුන්ට සෞඛ්‍ය සේවා වැඩසටහන් සහ ජාත්‍යන්තර රැකියා වෙළඳපොළට සරිලන වැඩසටහන් පිරිනමන විශ්ව විද්‍යාල/ ආයතන හතක් (7) පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා කර්මාන්ත සමීක්ෂණයක් කරන ලද අතර, එය ඉදිරි වැඩසටහන් ගවේෂණය කිරීම සඳහා ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ හුවමාරු කර කර ගන්නා ලදි.

ඉන්දුනීසියාවේ නාලන්දා බෞද්ධ විද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ විශ්වවිද්‍යාලවලින් පාලි සහ ඉංග්‍රීසි භාෂා කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කැමැත්තෙන් සිටින අතර චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික සිසුන් / වෘත්තිකයන් සඳහා 2023 වර්ෂයේදී ශිෂ්‍යත්ව පිරිනැමීමට චීනය කැමැත්තෙන් සිටී.

2.1.7. ජෝර්දාන් වෙළඳපොලේ අඹ සඳහා ආනයනික තහනම ඉවත් කර ගැනීම

ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව, ජෝර්දානය විසින් ශ්‍රී ලංකා අඹ සඳහා පනවා තිබූ ආනයන තහනම ඉවත් කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්ශවය විසින් එකඟ වූ නිරෝධායන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ජෝර්දානය වෙත අඹ අපනයනය දිගටම කරගෙන යාමේ හැකියාව ලැබේ.

2.1.8. ජර්මානු ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) ජර්මනිය සමඟ සම්බන්ධව කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර අමුද්‍රව්‍ය නිෂ්පාදකයින්/ අපනයනකරුවන් සඳහා යුරෝපා සංගම් වෙළෙඳපොළ ප්‍රවේශ පහසුකම් සැලසීම

ස්වභාවික අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම්වලට යුරෝපා සංගම් වෙළෙඳපොළ ප්‍රවේශය සඳහා සහාය වීමට ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධන කාර්යාලයක් පිහිටුවීම සඳහා ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- 80 දෙනෙකු සඳහා **"සැපයුම් දාමය ආශ්‍රිත සාමූහික, සමාජ වගකීම් සහ තිරසාරභාවය"** යන තේමාවෙන්, යුරෝපා සංගම් වෙළඳපොලේ එළඹෙන නව රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම සඳහා මාර්ග ගත ක්‍රමයට සම්මන්ත්‍රණයක් එකක් පවත්වන ලදී.
- IPD මූලාශ්‍ර මෙහෙයුම සඳහා සුදුසු සමාගම් හඳුනාගැනීම සඳහා, නව සමාගම් 10ක් වෙනුවෙන් ස්ථානීය පුහුණු වැඩසටහනක් යාපනයේ දී පවත්වන ලදී.
- ජර්මානු වෙළඳපොලේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ උපාය මාර්ගයක් ලෙස **“ඇසුරුම්කරණය සහ අගය එකතු කිරීම”** සම්බන්ධයෙන් සහභාගිවන්නන් 100 දෙනෙකු සඳහා ප්‍රමුඛ පෙළේ යුරෝපා සංගම් ආනයනකරුවෙකු සමඟ කෘෂි සංසදයක් පවත්වන ලදී.
- Bio Fach 2022 ප්‍රදර්ශනය සඳහා සහභාගී වන සමාගම් 25ක් සඳහා පූර්ව සූදානම් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.
- අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වන නව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පූර්ව සූදානම් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා අත්පොතක් සකස් කරන ලදී.
- නව සමාගම් 5ක් සඳහා IPD මගින් කරුණු සෙවීමේ මෙහෙයුම ක්‍රියාත්මක කර යුරෝපා සංගම් වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.
- දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 50ක් සඳහා ආයතනික සමාජ වගකීම (CSR) පිළිබඳ webinar එකක් පවත්වන ලදී.
- සගන්ධ තෙල් පිළිබඳ වෙළෙඳපොළ බුද්ධිය පිළිබඳ වාර්තාවක් කෙටුම්පත් කරන ලදී.

03. නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්

- අපනයන සංවර්ධන මණ්ඩලය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කුරුඳු අගය දාමයේ පාර්ශවකරුවන් සමඟ එක්ව ලංකා කුරුඳු GI සඳහා අභ්‍යන්තර සහ බාහිර පාලන යාන්ත්‍රණයන් පිහිටුවීම සඳහා කටයුතු කරන ලදී. ප්‍රධාන GI සංගමය හා සම්බන්ධ කිරීම සඳහා දිස්ත්‍රික් වශයෙන් කුරුඳු ගොවි සංගම් පිහිටුවා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. අගය දාමය අධීක්ෂණය කිරීම සඳහා හඳුනාගැනීමේ පද්ධතියක් ස්ථාපිත කරන ලදී.
- අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ අදාළ අපනයනකරුවන් සමඟ ශ්‍රී ලාංකේය ඖෂධීය රූපලාවන්‍ය නිෂ්පාදන සහ ආයුර්වේද නිෂ්පාදන සඳහා ජාතික ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සඳහා එක්ව කටයුතු කරන ලදී.
- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව(TVEC) සහ ශ්‍රී ලංකා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදකයින්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමයේ(SLEMEA) සහාය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2021 දී විදුලි හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට අවශ්‍ය නිපුණතා හිඟයන් සහ පුහුණුව හඳුනා ගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් (VET Plan) සකස් කරන ලදී. මෙම වාර්තාව මගින් දේශීය හා විදේශීය රැකියා සඳහා නිපුණතා සැපයුම සහ ඉල්ලුම, නිපුණතා හිඩැස් සහ පුහුණු අවශ්‍යතා, අනාගත ප්‍රවණතා සඳහා කුසලතා විශ්ලේෂණය කරන ලද අතර වසර 5 ක් සඳහා අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ද ඉදිරිපත් කර ඇත.

04. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන

- නව අපනයනකරුවන් සංවර්ධනය කිරීම සහ අපනයන වෙළෙඳපොළ අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් නව අපනයනකරුවන් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රාදේශීය ව්‍යවසායකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු, නිෂ්පාදකයන්- අපනයනකරුවන් සම්බන්ධීකරණ වැඩසටහන්, නිෂ්පාදන/ සැපයුම් සංවර්ධන වැඩසටහන් සහ වෙළෙඳපොළ නිරීක්ෂණ සංචාර යනා දී වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.
- අපනයන සංවර්ධන මණ්ඩලය සහ USAID හවුල්කාර ව්‍යාපෘතිය සමඟ එක්ව අපනයනය ඉලක්ක කරගත් කලාපවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය සඳහා අපනයන පහසුකම් සැලසීම පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් 05ක්, ඩිජිටල් ධාරිතා වර්ධනය පිළිබඳ වැඩසටහන් 07ක් සහ “ස්ත්‍රී පුරුෂ සමාජභාවය, කාන්තා සවිබල ගැන්වීම සහ සියලු පාර්ශවයන් ඇතුළත් සංවර්ධනය” පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් සංවර්ධන නිළධාරීන් 415ක් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ලෙස ක්‍රියාවට නංවන ලදී.

- නව අපනයනකරුවන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ, තෝරාගත් කාන්තා ව්‍යවසායකයින් 25 දෙනෙකු සඳහා 2022 මාර්තු 28 වන දින ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව අපනයන වෙළඳපොළක් සංවිධානය කරන ලදී. හොඳම අපනයන අභිමුඛ කාන්තා ව්‍යවසායිකාවන්ට ඔවුන්ගේ වෙළඳපල සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය පිරිනමන ලදී.
- 2021 අයවැය යෝජනාවට අනුකූලව, කඩදාසි බාස්කට්, TJC අඹ, වැනිලා, කිතුල් සහ කෝපි නිෂ්පාදන සඳහා අපනයන සැකසුම් ගම්මාන (EPV) 10 ක් ආරම්භ කරන ලදී. කෝපි ගම්මානය සඳහා රෝපණ ද්‍රව්‍ය බෙදාහරින ලද අතර කඩදාසි බාස්කට් ගම්මානය සම්බන්ධිත අපනයනකරු වෙත කඩදාසි කැපුම් යන්ත්‍රයක් ලබා දෙන ලදී. ඉතිරි ගම්මානවල ක්‍රියාකාරකම් ආරම්භ කළද, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලදී.
- කුඩා ගොවි කණ්ඩායම් විදේශීය වෙළෙඳපොළට සරිලන සේ සවිබල ගැන්වීමේ අරමුණින්, ජාත්‍යන්තරව පිළිගත් සහතික කිරීමේ ආයතනවලින් ජාතික/ ජාත්‍යන්තර කාබනික සහතිකය ලබා ගැනීමට ගොවීන්ට සහාය වීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල, මාකදුර සහ මාතර යන ප්‍රදේශවල පුහුණු වැඩසටහන් 3ක් පවත්වන ලද අතර ඊට සහභාගී වූවන්ගේ සංඛ්‍යාව 280කි.
- නව අපනයනකරුවන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම් 06 කට අගය එකතු කිරීම සහ ඇසුරුම්කරණය සංවර්ධනය සඳහා සහය විය.

05. අපනයනකරුවන් සඳහා වන සහය වැඩසටහන්

වෙළඳපල ප්‍රවේශ සහාය වැඩසටහන

අපනයනකරුවන්ට ඔවුන්ගේ වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2018 - 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලද වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන 2022 අවසානය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට මෙම වැඩසටහන යටතේ සමාගම් 93 කට සහය ලබා දී ඇත.

2019-2022 කාලපරිච්ඡේදය තුළ සෘජු අපනයනකරුවන් 53 ක් ඇමෙරිකානු ඩොලර් මිලියන 22.3 ක වර්ධනයක් සමඟින් 35.2% ක අපනයන වර්ධනයක් වාර්තා කළහ.

මීට අමතරව, නව අපනයනකරුවන් 13 දෙනෙකු ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වා දී ඇති අතර 2019-2022 කාලය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 7.0 ක (රු. බිලියන 1.7) අපනයන ආදායමක් උපයා ගන්නා ලදී.

06. අපනයනකරුවන් සඳහා පුහුණු වැඩසටහන්

- ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් අංශ පිළිබඳ සහතික පාඨමාලා දෙකක් 74 දෙනෙකු සඳහා පවත්වන ලදී.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්, විභව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 171 දෙනෙකු සඳහා ආනයන/ අපනයන ක්‍රියාපටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා තුනක් පවත්වන ලදී.
- බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැති Pro food Propack Agri-Biz ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ මණ්ඩපයක් ඇසුරුම් කර්මාන්තයේ නියැලී සිටින රජයේ පාර්ශවකාර ආයතන 13ක් නියෝජනය කරන ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය(NPC) විසින් සංවිධානය කරන ලදී. එයට සමගාමී ව කර්මාන්තකරුවන් සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි දෙකක් පවත්වන ලදී.
- අපනයන නිෂ්පාදන සඳහා ඇසුරුම්කරණ විසඳුම් හඳුන්වා දීම සඳහා අපනයන සමාගම් 35ක් ශ්‍රී ලංකාවේ ඇසුරුම්කරණ සමාගම් පහක් (05) සමඟ ව්‍යාපාරික හමු(B2B) පවත්වන ලදී.
- මොරටුව විශ්ව විද්‍යාලයේ අනුග්‍රහය ඇතිව ජාත්‍යන්තර වෙළෙඳපල සඳහා නිෂ්පාදන ඇසුරුම් සංවර්ධනය කිරීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම් 7 කට සහය විය.
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය සමඟ එක්ව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 18 දෙනෙකු වෙනුවෙන් සන්නාම නිර්මාණය සඳහා අගය දාමය ඉදිරියට ගෙන යාමට ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අපනයනයට සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 3ක් ඇතුළුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 25-30 ක පොකුරක් සඳහා "විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ විභවය" පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක් සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අපනයන විභවයක් සහිත සහ අපනයනයට සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 25-30 සඳහා "විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ විභවය" පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී. බෙල්ජියමේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය සමඟ එක්ව Aquametter කණ්ඩායම විසින් සංවිධානය කරන ලද බෙල්ජියම් ආනයන ව්‍යාපෘතියට සැසිවාරයෙන් හඳුනාගත් ගොවීන් තිදෙනෙකු (1- හෝමාගම සහ 2- හොරණ) සම්බන්ධ කරන ලදී.
- කාන්තා ව්‍යවසායකයින් 85 දෙනෙකු සඳහා ඊ-වාණිජ්‍යය සහ ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන UNESCAP ව්‍යාපෘතිය සමඟ එක්ව පවත්වන ලදී.
- විශ්වවිද්‍යාල සිසුන් 21 දෙනෙකු සඳහා මුද්‍රණ කර්මාන්තය සහ ජාත්‍යන්තර වෙළඳපල ප්‍රවණතා පිළිබඳව මාර්ගගත ක්‍රමයට සැසියක් පවත්වන ලදී.

- ඌව පළාතේ තාක්ෂණික ව්‍යවසායකයින් 20 දෙනෙකු සඳහා අපනයන අලෙවිකරණ සැලසුම් (EMP) වැඩසටහන පවත්වන ලද අතර එක් සමාගමකට USA Tech Event සඳහා සහභාගී වීමට පහසුකම් සැලසීය.
- අපනයනකරුවන් සහ විභව අපනයනකරුවන් 104 දෙනෙකු සඳහා චීන වෙළඳපල අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීමේ වෙබ් අඩවියක් පවත්වන ලදී.
- පකිස්ථානයේ අදාළ වෙළඳ සංගම් සඳහා බිත්ති ටයිල් සහ බිම ටයිල් ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ දෙකක් සංවිධානය කරන ලදී.
- අපනයනකරුවන් සහ අනාගත අපනයනකරුවන් 60 දෙනෙකු සඳහා “කුවේට් - ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය සහ B2B රැස්වීම්" පිළිබඳ මාර්ගගත ක්‍රමයට සැසියක් සංවිධානය කරන ලදී.
- විවිධ අංශවල නියැලී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 252ක් සඳහා අපනයන වෙළෙඳපොළ අවස්ථා සහ අපනයන ක්‍රියා පටිපාටි, ඇසුරුම්කරණය සංවර්ධනය, ව්‍යාපාර සායනය වැනි ධාරිතා සංවර්ධන වැඩසටහන් 09ක් පවත්වන ලදී.
- දකුණු පළාතේ සහ මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 70 දෙනෙකු සඳහා “වත්මන් අපනයන වෙළෙඳපොළ අවස්ථා සහ වෙළඳපල ප්‍රවණතා” පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය සමඟ එක්ව කාන්තා ව්‍යවසායකයින් 25 දෙනෙකු සඳහා අපනයන වෙළෙඳපොළ සහ අපනයන ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- WE Connect International සමඟ සහයෝගයෙන් කාන්තා ව්‍යවසායකයින් 80 දෙනෙකු සඳහා අපනයන ක්‍රියාපටිපාටිය ඇතුළුව Export Lead Generation පිළිබඳ මාර්ගගත වැඩසටහනක් පවත්වන ලදී.
- පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 50ක් සඳහා සමාජ මාධ්‍ය හරහා විද්‍යුත් වාණිජ්‍යය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- මාර්ගගත ක්‍රමය ඔස්සේ ඩිජිටල් අලෙවිකරණ වැඩසටහනක් 89 දෙනෙකු සඳහා පවත්වන ලදී.
- කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් 75 දෙනෙකු සඳහා eBay Selling පිළිබඳ මාර්ගගත ක්‍රමය ඔස්සේ වැඩමුළුවක් පවත්වන ලදී.
- ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය සමඟ එක්ව සංවර්ධන නිළධාරීන් 149 ක් සඳහා මාර්ගගත ක්‍රමයට සැසියක් පවත්වන ලදී.
- අපනයනකරුවන් 108 දෙනෙකු සඳහා "ජපානයට සෞඛ්‍ය ආහාර අපනයනය කිරීම - රීති සහ රෙගුලාසි" පිළිබඳ මාර්ගගත සැසියක් පවත්වන ලදී.

07. අපනයනය සම්බන්ධ ප්‍රකාශන

- බිස්නස් ලංකා (Business Lanka) සඟරාවේ එක් කලාපයක් “ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්මාන්තය ලෝකය සමඟ සම්බන්ධ කිරීම” පිළිබඳව ශ්‍රී ලංකාවේ අපනයන හැකියාවන් ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. එය රටවල් 125ක ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල, වෙළෙඳ මණ්ඩල, වෙළෙඳ ප්‍රවර්ධන ආයතන වැනි ගෝලීය ගමනාන්ත 137ක් අතර බෙදා හරින ලදී.
- ජාත්‍යන්තර වෙළඳාම, සිදුවීම් සහ සාර්ථක වීම් පිළිබඳ යාවත්කාලීන වෙළඳපල බුද්ධිය සැපයීම සඳහා “Expo News” මාසික විද්‍යුත් සඟරාවේ කලාප හතක් ප්‍රකාශයට පත් කර අපනයනකරුවන් අතර බෙදා හරින ලදී.
- අපනයනකරුවන් අතර වෙළඳපල මිල, ප්‍රවණතා, නව තාක්ෂණික වැඩිදියුණු කිරීම් පිළිබඳ තොරතුරු සංසරණය කරන ලදී.
- අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශනය “අපනයන කාර්ය සාධන දර්ශක 2021” අන්තර්ජාල මිලදී ගැනීම් සඳහා ප්‍රවේශය සහිත ව මණ්ඩලයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

08. උපදේශන කමිටු

- 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය යටතේ 2021 ජූලි 15 වැනි දින වසර 5 ක කාලයක් සඳහා උපදේශන කමිටු 24ක් පිහිටුවන ලදී. (ඇඟළුම්, ආයුර්වේද සහ ඖෂධීය රූපලාවන්‍ය, බෝට්ටු හා නැවු නිෂ්පාදනය, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන, ඉදිකිරීම් සේවා, අධ්‍යාපන සේවා, විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග, අපනයන නිෂ්පාදන ගම්මාන, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ සේවා, ලුහු ඉංජිනේරු භාණ්ඩ, සැපයුම් සහ කාර්ය උපාය, සමුද්‍ර සහ අක්වෙරළ ඉංජිනේරු, ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන, ජාතික තත්ත්ව යටිතල පහසුකම්, කාබනික නිෂ්පාදන, විසිතුරු මත්ස්‍ය, ඖෂධ, සැකසූ ආහාර සහ පාන, අපනයනය සඳහා ප්‍රාදේශීය සංවර්ධනය, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන හා ප්ලාස්ටික් භාණ්ඩ, මුහුදු ආහාර සහ ජල ජීවී වගා අංශය, කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන, වෙළඳ ප්‍රවර්ධන හා වෙළඳ තොරතුරු). උපදේශන කමිටු අපනයන ක්ෂේත්‍රයන් හි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛතා ගැටළු සහ අවස්ථා හඳුනා ගන්නා පුද්ගලික-රාජ්‍ය සහයෝගීතාවයට නායකත්වය ලබා දේ. 2022 වර්ෂය තුළ උපදේශන කමිටු රැස්වීම් 45ක් පැවැත්විණි. වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී, තීරුබදු සහ තීරුබදු නොවන බාධක ඉවත් කිරීමේදී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය උපදේශන කමිටුවලින් අදහස් සහ යෝජනා ලබා ගන්නා ලදී.

- අපනයන සංවර්ධන මණ්ඩලය උපදේශන කමිටු සමඟ සාකච්ඡා කර රටෙහි අස්ථාවර ආර්ථික තත්ත්වයන්හි දී අපනයනකරුවන්ට අඛණ්ඩ සහාය ලබා දීමෙන් පහසුකම් සලස්වන ලදී. රටේ ඉන්ධන අර්බුධය පැවැති අවස්ථාවේ දී අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන්ට ඔවුන්ගේ සතිපතා ඉන්ධන අවශ්‍යතාවය Ceypetco වෙතින් ඩොලර් වලින් ගෙවීමෙන් සෘජුව මිලදී ගැනීමට පහසුකම් සලසන ලදි. එමෙන්ම මණ්ඩලය විසින් අපනයනකරුවන්ට ඔවුන්ගේ ඉන්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා IOC වෙත නිර්දේශ ලබා දීමෙන් ද පහසුකම් සැලසීය.

09. ඊ-වෙළඳපොල - ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා මාර්ගගත ප්‍රවර්ධන

වෙළඳපල ප්‍රවේශය, B2B සහ B2C ගණුදෙණු වැඩිකිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විද්‍යුත් වාණිජ සේවා සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (www.srilankabusiness.com) සිය වෙබ් අඩවිය ප්‍රවර්ධනය කර ඇත.

මෙහි දී;

- සම්භාවනීය අමුත්තන් 1,265,258 පිටු බැලීම් 4,263,352
- වෙබ් අඩවි යාවත්කාලීන කිරීම් - 11428+
- බ්ලොග් සටහන් 61ක් 248,028 පරිශීලක පැමිණීම්
- මුහුණු පොතේ පළ කිරීම් - 467, හැඟීම් - 2,117,945 , ළඟාවීම් - 2,049,274
- ට්වීට් - 441, හැඟීම් - 153,501, පැතිකඩ පැමිණීම්- 57,041, සඳහන් කිරීම් - 300, නව අනුගාමිකයින්- 490
- LinkedIn පළ කිරීම්- 364, හැඟීම් - 539,933, අනුගාමිකයින්- 25,060
- B2B විමසීම්- 2,129
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන මාර්ගගත ගෙවීම් ද්වාරය හරහා රු. 1,664,082.61 ගෙවීම් ලැබී ඇත.

- 10 -

2023 ඉදිරි සැලසුම්

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) අපනයන ඉහළ නැංවීමට තුඩු දෙන ජාත්‍යන්තර වෙළඳ තරගකාරිත්වය ළඟා කර ගනිමින් තම ව්‍යාපාර වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස පවත්වා ගෙන යාමට ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට සහ විභව අපනයනකරුවන්ට අඛණ්ඩව සහාය වෙමින් සිටී.

අපනයන සංවර්ධන මණ්ඩලය නව වෙළෙඳපොළ ප්‍රවේශය, නව අපනයනකරුවන් සංවර්ධනය, සන්නාමකරණය, අගය එකතු කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ සඳහා සමගාමී ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කෙරේ.

2023 වසර සඳහා අපනයන ඉලක්කය ඩොලර් බිලියන 18.9 ක් වන අතර එයින් ඩොලර් බිලියන 16.7 ක් වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ද ඩොලර් බිලියන 2.2 ක් සේවා අපනයනයෙන් ද අපේක්ෂා කෙරේ.

ඉහත ඉලක්කය සපුරා ගැනීම සඳහා, වත්මන් ගෝලීය තත්ත්වය සැලකිල්ලට ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද නව ආයතනික සැලැස්මේ දක්වා ඇති පහත සඳහන් උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් අනුකූල කෙරේ.

- ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා සඳහා කැපී පෙනෙන ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම.
- ඉහල අගය එකතු කිරීම සහ සන්නාමකරණය සමඟ නිෂ්පාදන සහ සේවා අපනයන වටිනාකම වැඩි කිරීම.
- පවතින වෙලඳපොලවල් වෙත සිදු කරන අපනයනයන් සිදු කරන අතරම අනාගත ඉලක්ක වෙළඳපළ වෙත අපනයනය වැඩි කිරීම.
- වඩා හොඳ වෙළඳපළ ප්‍රවේශයක් සහිත කලාපීය අගය දාම ජාල සමඟ ඒකාබද්ධ වීම.
- අපනයන ක්ෂේත්‍රය සඳහා අගය දාම ක්‍රියාකාරීන්ගේ දායකත්වය වැඩි දියුණු කිරීම.
- අපනයන සංයුතිය සහ රටේ අපනයනකරුවන්ගේ ප්‍රජාව පුළුල් කිරීම.
- කාර්යක්ෂම, පාරදෘශ්‍ය සහ පිරිවැය දේශ සීමා වෙළඳාම සහතික කිරීම සඳහා වෙළෙඳ පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර රෙගුලාසි සහ ප්‍රමිතීන්ට අනුකූල වීමට අපනයනකරුවන් දිරිමත් කිරීම සහ පාරිසරික, සමාජීය සහ පාලන මූලධර්මයන් (ESG) හි සාමූහික ප්‍රතිලාභ ලබා ගැනීම.

- සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මූලික වටිනාකම් මත පදනම් ව, අපනයන සංවර්ධන මණ්ඩලය හි විශිෂ්ට කණ්ඩායමක් ගොඩනැගීම.

ගෝලීය වෙළඳ/ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්වීම් හේතුවෙන් දැනට පවතින කර්මාන්ත ආරක්ෂා කර ගනිමින් සහ නව අපනයන මාර්ග ගවේෂණය කරමින් අපනයනය තිරසාර කිරීම සඳහා අවධානය යොමු කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී අපනයන සංවර්ධන මණ්ඩලය උපදේශන කමිටු සහ අංශ සංගම්වල උපදෙස් ලබා ගනී.

ශ්‍රී ලාංකේය නිෂ්පාදන සහ සේවා සඳහා ගෝලීය වශයෙන් වෙළෙඳපොළ ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසෙන පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- තෝරාගත් ප්‍රමුඛතා සහ නැගී එන වෙලඳපොලවල් වල භෞතික හා මාර්ගගත ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය සංවිධානය කිරීම.

- තෝරාගත් වෙලඳපොලවල භෞතික සහ මාර්ගගත වෙළඳ ධුර මණ්ඩල සාකච්ඡා සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාවේ සැපයුම් ධාරිතාව පිළිබඳ ගැනුම්කරුවන්ගේ විශ්වාසය යළි තහවුරු කිරීම සඳහා රටේ ප්‍රතිරූපය ගොඩනැගීම
- අපනයන සන්නාමකරණය
    - ශ්‍රී ලංකාව සන්නාමකරණය සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ගෝලීය වශයෙන් ස්ථානගත කිරීම
    - ශ්‍රී''ලංකා කුරුඳු'' සන්නාම සංවර්ධන සහ ප්‍රවර්ධන වැඩසටහන
    - ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය (GI).
    - Pure Ceylon Cinnamon සහ 'Ceylon Spices' බලපත්‍ර වැඩසටහන - නිකුත් කිරීම
    - වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සහ අලුත් කිරීමේ ක්‍රියාවලිය භාවිතා කිරීමට සුදුසුකම් ලත් අපනයනකරුවන්ට බලපත්‍රය
    - තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය සඳහා IoI සන්නාමය ප්‍රවර්ධනය කිරීම.
    - ශ්‍රී ලංකා කාබනික සන්නාමය ප්‍රවර්ධනය කිරීම
- නව අපනයනකරුවන් සංවර්ධනය (200)
- ගෝලීය අගය දාමය සමඟ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සුළු හා මධ්‍ය ව්‍යවසායකයන් සම්බන්ධ කිරීම.
- අපනයන ප්‍රමුඛ හවුල් ව්‍යාපාර ආයෝජන දිරි ගැන්වීම
- වෙළඳපළ තොරතුරු, වෙළඳපළ අධ්‍යයනය/ පර්යේෂණ, යනාදිය.

- ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සමාලෝචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- කලාපීය ඒකාබද්ධ කිරීමේ සාකච්ඡා වලට සහභාගී කිරීම/ නිදහස් වෙළෙඳ ගිවිසුම, වරණීය වෙළෙඳ ගිවිසුම
- අපනයන සැපයුම් පදනම සංවර්ධනය
- නව අපනයනකරුවන් සංවර්ධනය
- කාන්තා ව්‍යවසායකයින් සංවර්ධනය
- එක් ගම්මානයක් - එක් නිෂ්පාදනයක් වැඩසටහන (OVOP) ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික අගය දාමයේ විශ්වසනීයත්වය සහ ප්‍රතිරූපය ආරක්ෂා කිරීම.
- ජර්මනියේ ආනයන ප්‍රවර්ධන ආයතනය (IPD) සමඟ සම්බන්ධ වී කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයින්/ අපනයනකරුවන් සඳහා යුරෝපා සංගම් වෙළෙඳපොළ ප්‍රවේශ පහසුකම් සැලසීම.
- තොරතුරු තාක්ෂණ සන්නිවේදන/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කර්මාන්තය ජපාන වෙළඳපොළට ප්‍රවර්ධනය කිරීම
- වෙළඳපළ ප්‍රවර්ධන ආධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- උපදේශන කමිටු අධීක්ෂණය
- කර්මාන්තයෙහි විශේෂිත ගැටළු විසඳා ගැනීමට සහය වීම
- අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීම [අපනයනකරුවන්ගේ සංසදය]
- ජනාධිපති අපනයන සම්මාන පිරිනැමීම මගින් අපනයනකරුවන් ඇගයීම සහ දිරිමත් කිරීම
- වෙළඳ පල සංඛ්‍යාලේඛන සහ ගැනුම්කරුවන්ගේ තොරතුරු සැපයීම
- ප්‍රකාශන - Business Lanka සඟරාව, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ නාමාවලිය 2022, අපනයන කාර්ය සාධන දර්ශක
- වෙළඳ තොරතුරු, ඊ-වාණිජ්‍ය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන සැපයීම
- ප්‍රවර්ධන අත් පත්‍රිකා
- ආනයන/අපනයන ක්‍රියා පටිපාටි, ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් අංශ සහ අපනයන ඇසුරුම් පිළිබඳ සහතික පාඨමාලා
- විද්‍යුත් පුස්තකාලය
- අපනයන සංවර්ධන මණ්ඩල වීඩියෝව
- අපනයන සංවර්ධන මණ්ඩල - වෙබ් අඩවිය
- අපනයන සංවර්ධන මණ්ඩල වෙබ් අඩවිය හරහා ශ්‍රී ලාංකේය නිෂ්පාදන සහ සේවා ඔන්ලයින් ප්‍රවර්ධනය කිරීම
- අපනයන ආශ්‍රිත විෂයයෙන්, නිපුණතා සංවර්ධන සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පිළි බඳව භෞතික හා මාර්ග ගත දැනුවත් කිරීම

- කාබනික කෘෂිකාර්මික අංශය පිළිබඳ වාර්තාමය වීඩියෝවක් සකස් කිරීම
- SLS 1324:2018 ප්‍රකාර කාබනික සහතික කිරීම හරහා අපනයනය නැඹුරු කාබනික සැපයුම් දාම සංවර්ධනය
- ශ්‍රී ලාංකේය ව්‍යවසායකයින්ට විදේශීය වෙළඳපළ තුළ ස්වදේශීය සන්නාම සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන
- ශ්‍රී ලංකාවේ ඖෂධ ක්ෂේත්‍රය සඳහා උපාය මාර්ගයක සැලැස්මක් සකස් කිරීම

ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් අංශය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා මධ්‍ය කාලීනව ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය [2022-2024]

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය රටේ අපනයන ආදායම ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනයට දායක වීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනු වෙළෙඳ ප්‍රවර්ධනය සඳහා වන රජයේ ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත ආයතනය වේ. ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ ඕනෑම කාරණයක් සඳහා ප්‍රමුඛ විශාල කාර්යභාරයක් එමගින් ඉටු කෙරේ. ජාතික අපනයන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රතිපත්ති උපදේශක, අධීක්ෂක , ප්‍රවර්ධක, පහසුකම් සපයන්නා සහ දැනුම සපයන්නා ලෙස විවිධ කාර්යභාරයකන් ඉටු කරයි.

ඒ අනුව, අපනයන සංවර්ධන මණ්ඩලය විවිධ ක්ෂේත්‍ර හරහා අපනයනකරුවන් සංවර්ධනය සහ අපනයන ප්‍රවර්ධනය සිදු කරනු ලබයි.

1. **ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා සඳහා ගෝලීය වශයෙන් වෙළඳපල ප්‍රවේශය නිර්මාණය කිරීම, මෙහිදී කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරේ**

   - තෝරාගත් ප්‍රමුඛ සහ නැගී එන වෙලඳපලවල ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.
   - තෝරාගත් වෙළඳපල තුළ අභ්‍යන්තර සහ බාහිර වෙළඳ මෙහෙයුම් සංවිධානය කිරීම.
   - වෙළඳපල බුද්ධිමය තොරතුරු සැපයීම.
   - අපනයනකරුවන් ගැනුම්කරුවන් හා සම්බන්ධ කිරීම සඳහා විදේශ සබඳතා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සමීපව කටයුතු කිරීම.
   - හඳුනාගත් අංශ සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ සහ ව්‍යාපර හමුවන් සංවිධානය කිරීම.
   - ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් සහ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් සමඟ දිවිපාර්ශවික සබඳතා පවත්වාගෙන යාම

2. **නව අපනයනකරුවන් සංවර්ධනය**
   - කලාපවල විභව අපනයනකරුවන්/ ව්‍යවසායකයින් හඳුනා ගැනීම
   - හඳුනා ගත් විභව අපනයනකරුවන්/ ව්‍යවසායකයින්, අපනයනකරුවන් ලෙස හැඩගැන්වීම සඳහා ධාරිතා සංවර්ධනය
   - ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට සහ අනෙකුත් රට/වෙළඳපොල අවශ්‍යතා වලට අනුකූල ව නිෂ්පාදන සංවර්ධනය
   - අපනයන වෙළෙඳපොළට හඳුන්වා දීම.

3. **ශ්‍රී ලංකාව සන්නාම කිරීම සහ ශ්‍රී ලංකා නිෂ්පාදන ගෝලීය වශයෙන් ස්ථානගත කිරීම.**
   - කුරුඳු, කැසියා වලින් වෙන්කර හඳුනා ගැනීම සඳහා "Pure Ceylon Cinnamon" වෙළඳ ලකුණු ප්‍රවර්ධනය
   - "Ceylon Spices" සන්නාම ප්‍රවර්ධන වැඩසටහන
   - ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය ප්‍රවර්ධන වැඩසටහන
   - IOI සන්නාමය ICT සේවා සඳහා ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.
   - "Sri Lanka Export Brand" යටතේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම

4. වෙළඳපල තොරතුරු සහ වෙළඳපල බුද්ධිය

- වෙළඳ තොරතුරු, වෙළඳපල බුද්ධිය, විද්‍යුත් -වාණිජ්‍ය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන සැපයීම
- Business Lanka සඟරාව
- ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම

5. ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා මාර්ගගත ක්‍රම ඔස්සේ ප්‍රවර්ධනය

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා මාර්ගගත ප්‍රවර්ධනය
- ජාත්‍යන්තර වෙළඳාමේ වෙනස් වීම් අවස්ථා පිළිබඳ වෙළඳපල ඇඟවීම් ප්‍රකාශයට පත් කිරීම

6. අපනයනකරුවන්ට සහය වීම සහ උපදෙස් දීම

- "HELP DESK" හරහා අපනයනකරුවන්ට සහය වීම
- අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා අපනයනකරුවන්ගේ සංසදය පැවැත්වීම
- වෙළඳපල සංවර්ධන ආධාර යෝජනා ක්‍රමය (2022)
- ජනාධිපති අපනයන සම්මාන පිරිනැමීම හරහා අපනයනකරුවන් හඳුනා ගැනීම
- ස්ථාපිත උපදේශන කමිටු අධීක්ෂණය (24)
- ආනයන/අපනයන ක්‍රියා පටිපාටි, ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් අංශ සහ අපනයන ඇසුරුම් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- අපනයන ආශ්‍රිත විෂයන්, නිපුණතා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

7. සැපයුම් සංවර්ධනය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

- ජාතික කාබනික පාලන ඒකකය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම
- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික අගය දාමයේ විශ්වසනීයත්වය සහ ප්‍රතිරූපය ආරක්ෂා කිරීම
- එක් ගමක් එක් නිෂ්පාදනයක් වැඩසටහන හරහා අපනයන සැපයුම් පදනම සංවර්ධනය කිරීම
- කාන්තා ව්‍යවසායකයින් සංවර්ධනය

8. අපනයන නිෂ්පාදන ගම්මාන (EPV)

- අපනයන නිෂ්පාදන ගම්මාන සඳහා නිෂ්පාදන හඳුනා ගැනීම
- හඳුනාගත් නිෂ්පාදන සඳහා සුදුසු භූගෝලීය ස්ථාන හඳුනා ගන්න
- පොකුරු සංවිධානය කිරීම සහ අපනයන නිෂ්පාදන ගම්මාන පිහිටුවීම
- අපනයනකරුවන් ලෙස ඔවුන්ව හැඩගැන්වීම සඳහා ධාරිතා ගොඩනැගීම
- නිෂ්පාදන සංවර්ධනය සහ ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට සහ අනෙකුත් රට/වෙළඳපොල අවශ්‍යතා වලට අනුකූල වීම
- අපනයන වෙළෙඳපොළට හඳුන්වා දීම සහ අපනයන සමාගම් සමඟ සම්බන්ධ වීම

9. අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම

9.1 ජාතික අයවැය යෝජනා 2018/2019

- "අපනයන වෙළඳපල ප්‍රවේශ සහාය" වැඩසටහන (2018-2022)
- ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම (2018-2022)

9.2 ජාතික අයවැය යෝජනා 2021 අඛන්ඩව ක්‍රියාත්මක කිරීම

- ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්ට විදේශීය වෙළඳපල තුළ ස්වදේශීය සන්නාම සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සහාය වීම සඳහා ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන

9.3 ජාතික අයවැය 2022

- අපනයන සැකසුම් ගම්මාන පිහිටුවීම (ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව තාවකාලික ව නවතන ලදි)
- ශ්‍රී ලංකාවේ තිරසාර කාබනික කෘෂිකර්ම ක්‍රමය සංවර්ධනය කිරීම.

9.4 අතුරු අයවැය 2022

- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය නැවත සක්‍රිය කිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම

9.5 ජාතික අයවැය 2022

- **ත්‍රෛලෝක විජයපත්‍ර අපනයනය සඳහා පමණක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පරීක්ෂා** කිරීම

ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් අංශය

- 12 -

මූල්‍ය ප්‍රකාශන

2022

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2021.12.31 රු.
ආදායම			
ආදායම	(3)	478,466,579	515,589,117
අනෙකුත් ආදායම්	(4)	101,573,893	54,683,378
මුළු ආදායම		580,040,472	570,272,495
ආයෝජන හා අනෙකුත් ලැබීම් සඳහා හානිකරණ වෙන්කිරීම්	(5)	(137,446,488)	(408,000)
වියදම්			
අපනයන සංවර්ධන වියදම්	(6)	145,840,678	109,674,355
පරිපාලන වියදම්	(7)	356,829,387	372,422,060
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වියදම් ඉක්ම වූ ආදායම		214,816,895	88,584,080
මූල්‍ය වියදම්	(8)	193,106	298,124
වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය			
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින්		214,623,789	88,285,956
ආශ්‍රිත සමාගමේ ලාබ/(අලාභ) කොටස		4,233,297	123,423,728
		218,857,086	211,709,684
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
- දේපළ, පිරියත ප්‍රත්‍යාගණනයේ ලාභය		85,996,927	-
මූල්‍ය වත්කම්			
ආයුගණක තක්සේරු ලාභය/පාඩුව		9,475,227	-
වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්		95,472,154	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**314,329,240**	**211,709,684**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.01.01 රු.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ, ශුද්ධ	(9)	101,407,909	22,662,353	29,546,271
අස්පෘශ්‍ය වත්කම් (ශුද්ධ)	(10)	145,298	212,998	255,010
ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තු ගත (	(11)	1,251,263,603	1,247,030,306	1,123,606,578
		1,352,816,810	1,269,905,657	1,153,407,859
අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම්	(12)	202,472,821	64,828,401	63,393,931
මුළු ජංගම නොවන වත්කම්		1,555,289,631	1,334,734,058	1,216,801,790
ජංගම වත්කම්				
තොග	(13)	3,225,364	2,658,056	2,857,903
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	(14)	12,397,592	24,636,075	139,018,779
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	(15)	38,116,012	23,888,693	7,154,464
මුදල් හා මුදල් සමාන දෑ	(16)	121,808,990	64,764,983	27,734,026
		175,547,958	115,947,807	176,765,172
මුළු වත්කම්		**1,730,837,589**	**1,450,681,865**	**1,393,566,962**
හිමිකම් හා වගකීම්				
ප්‍රාග්ධනය හා සංචිත				
ලැබූ ප්‍රදානයන් - හිමිකම් දායකත්වය	(17)	10,014,284	10,014,284	10,014,284
වියදම් ඉක්ම වූ උපචිත ආදායම		1,554,359,474	1,241,833,712	1,143,228,077
මුළු හිමිකම්		1,564,373,758	1,251,847,996	1,153,242,361
ප්‍රදානයන්				
ලැබූ ප්‍රදානයන් - අනෙකුත්	(18)	14,933,725	18,896,444	23,923,318
		14,933,725	18,896,444	23,923,318
ජංගම නොවන වගකීම්				
වෙන් කිරීම් හා අනෙකුත් වගකීම්	(19)	58,373,071	37,050,196	22,700,377
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(20)	27,771,814	68,224,580	77,267,378
		86,144,885	105,274,776	99,967,755
අනෙකුත් ගෙවිය යුතු	(21)	65,385,221	74,662,649	116,433,528
		65,385,221	74,662,649	116,433,528
මුළු හිමිකම් හා වගකීම්		**1,730,837,589**	**1,450,681,865**	**1,393,566,962**

පිටු අංක 11 සිට 22 දක්වා වූ ගිණුම්කරන ප්‍රමිත හා පිටු අංක 23 සිට 39 දක්වා වන සටහන්, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අනුව සැකසූ මෙම මූල්‍ය ප්‍රකාශනවලම ඒකාබද්ධ කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකීම දරන අතර මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අතර ඒ වෙනුවෙන් අත්සන් තබනුයේ,

ආචාර්ය. කිංග්ස්ලි බර්නාඩ්	කේ.ඒ.විමලෙන්තිරාජා	ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ	කේ.ඩී.පෙරේරා
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂ - මුදල්**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

		හිමිකම් දායකත්වය	සංචිත පොළිය	ප්‍රත්‍යාගණනිත සංචිතය	එකතුව
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(23.3)**	10,014,284	1,143,228,077	-	1,153,242,361
වියදම් ඉක්ම වූ ආදායම		-	211,709,684		211,709,684
පූර්ව වර්ෂ ගැලපුම්		-	(113,104,049)	-	(113,104,049)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,014,284**	**1,241,833,712**	**-**	**1,251,847,996**
වියදම් ඉක්ම වූ ආදායම		-	228,332,313	85,996,927	314,329,240
පූර්ව වර්ෂ ගැලපුම්	**(24)**	-	(1,803,478)		(1,803,478)
2022 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**10,014,284**	**1,468,362,547**	**85,996,927**	**1,564,373,758**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
බදුවලට පෙර වර්ෂය සඳහා අතිරික්තය		314,329,240	211,709,684
ගැලපුම් කළා			
ස්ථාවර වත්කම් ක්ෂය කිරීම		10,586,350	8,951,192
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		67,500	312,013
ආයෝජන ආදායම		(102,639,316)	(165,701,000)
මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන ලාභය		(85,996,927)	-
ආයුගණක තක්සේරු ලාභය/ පාඩුව		(9,475,227)	-
පූර්ව වර්ෂ ගැලපුම්		(1,803,478)	47,652
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		(6,113,619)	(7,364,148)
පාරිතෝෂික සඳාහ වෙන් කිරීම්		(24,525,105)	9,196,815
කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය		3,519,821	4,075,746
ගැලපුම් කළ පොළිය		3,656,960	(3,259,226)
විවිධ වත්කම් මිල දී ගැනුම්		81,121.00	
ස්ථාවර වත්කම් අලෙවිය		(415,449)	
වටිනාකමක් වශයෙන් හානිකරණය සඳහා වෙන්කිරීම්		(137,446,488)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)		**(36,174,617)**	**57,968,728**
තොග (වැඩිවීම)/ අඩුවීම		(567,308)	199,847
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම		3,931,801	(1,019,989)
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්වල (වැඩිවීම)/ අඩුවීම		(15,112,268)	(16,734,230)
වෙන්කිරීම් හා අනෙකුත් වගකීම් (වැඩිවීම)/ අඩුවීම		21,322,875	14,349,819
අනෙකුත් ගෙවිය යුතු (වැඩිවීම)/ අඩුවීම		(10,542,428)	(41,770,873)
මෙහෙයුම්වලින් ජනිත මුදල්		**(37,141,945)**	**12,993,302**
ගෙවන ලද මූල්‍ය පිරිවැය			-
ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්		(6,452,434)	(18,239,613)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්		**(43,594,379)**	**(5,246,311)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
අපනයනකරුවන්ගේ ණය ආපසු අය කර ගැනීම		626,500	-
ණය ආපසු අයකරගැනීම		1,190,418	-
ස්ථාවර වත්කම් අලෙවිය	3	415,449	-
දේපළ. පිරියත හා උපකරණ අත්පත් කරගැනීම	9	(2,150,900)	(2,337,274)
ලැබූ ලාභාංශ	4	90,668,264	40,345,573
ලැබූ පොලී ආදායම	4	7,737,755	1,931,698
ආයෝජන ක්‍රියාකාරකම්වල උපයෝජනය කළ ශුද්ධ මුදල්		**98,487,486**	**39,939,997**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ (උපයෝජනය කළ)			
රජයේ ප්‍රදාන වශයෙන් ලැබූ		2,150,900	2,337,274
මූල්‍ය ක්‍රියාකාරකම්වල උපයෝජනය කළ ශුද්ධ මුදල්		**2,150,900**	**2,337,274**
මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**57,044,007**	**37,030,959**
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**64,764,983**	**27,734,024**
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**121,808,990**	**64,764,983**
මුදල් හා මුදල් සමාන දෑ වල විශ්ලේෂණය			
අතැති මුදල්	16	1,000	27,234
බැංකුවේ ඇති මුදල් - වාසිදායක	16	121,807,990	64,737,749
		121,808,990	**64,764,983**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තාකරණය සඳහා අධිකාරියේ කළමනාකාරිත්වයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනතේ 16 වැනි වගන්තිය (රාජ්‍ය සංස්ථා සඳහා (මුදල් පාලන) පනතේ විධිවිධාන යෙදීම) ප්‍රකාරව, මණ්ඩලයේ කළමනාකාරිත්වය පහත කරුණු සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

i. අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලුම මූල්‍ය ගනුදෙනු පිළිබඳ විධිමත් ගිණුම් පොත් පවත්වාගෙන යෑම.

ii. මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්මත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීම.

iii. මණ්ඩලයේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් හා අනෙකුත් අක්‍රමවත් ක්‍රියා වැළැක්වීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

1.1 ප්‍රතිෂ්ඨාපනය හා නෛතික ආකාරය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 1979 අංක 40 දරන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ප්‍රතිෂ්ඨාපිත කර තිබේ. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, නවම් මාවතේ අංක 42 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමට සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යෙහි අපනයන සංවර්ධන මණ්ඩලය මූලික වශයෙන් නිරත වේ.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 සැප්තැම්බර් මස 05 වැනි දින අනුමත කර තිබේ.

1.4 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මණ්ඩලය විසින් නිකුත් කළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් (IFRS) නියෝජනය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS සහ LKASs) වලට අනුකූලව 2022 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා සටහන් සමඟ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල සාරාංශයක් (“මූල්‍ය ප්‍රකාශ”) පිළියෙල කර ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

1.6 මිනුම්කරණයේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගයට නියමිත අනාවරණය කිරීම් සිදුකර ඇත්නම් හැර, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර තිබේ. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවයේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පිළිබිඹු කිරීම අනුව පෙළගස්සවා කාණ්ඩ ගතකර තිබේ.

1.7 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, කළමනාකාරිත්වය විසින් මණ්ඩලයට සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තක්සේරු කර ඇත. අපේක්ෂිත අනාගතය සඳහා මෙහෙයුම් කටයුතුවල පවත්වාගෙන යෑම සඳහා මණ්ඩලය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකාරිත්වයට සාධාරණ අපේක්ෂාවක් පවතී. අනාගතය සම්බන්ධයෙන් පවතින සියලු තොරතුරු අවධානයට යොමුකළ විට, ඈවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවත්වීම සඳහා අවශ්‍යතාවයක් මණ්ඩලයට කලින් දැනගත නොහැකි ය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය දිගටම යොදාගනු ඇත.

1.8 ශේෂ පත්‍ර දිනට තවමත් බලාත්මක වී නොමැති නමුත් නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිතීන්

දැනට ක්‍රියාත්මක වන ප්‍රමිතීන් සඳහා පහත දැක්වෙන නව ප්‍රමිතීන්, සංශෝධන හා අර්ථ නිරූපණයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර තිබුණ ද, මෙම මූල්‍ය ප්‍රකාශ බලාත්මක වන දිනය දක්වාම ක්‍රියාත්මක වී නොමැත. එම නව ප්‍රමිතීන් මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීම ඔස්සේ ඇතිවිය හැකි බලපෑම තවමත් තක්සේරු කර නොමැති අතර, මෙම ප්‍රමිතීන්, අර්ථ නිරූපණ හා සංශෝධන බලාත්මක වූ විට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වේ යැයි අපේක්ෂා කරන අතර, එවිට අධිකාරිය විසින් දැනට පවතින ප්‍රමිතීන් සඳහා මෙම ප්‍රමිතීන්, අර්ථ නිරූපණ හා සංශෝධන යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

SLFRS 17 රක්ෂණ ගිවිසුම්

1.9 ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය

මණ්ඩලයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

1.10 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන්

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් එහි වාර්තාකරණ දිනයට වාර්තාවන ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාවන අගයන් හා අවිනිශ්චිත වගකීම් මත බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන ගැනීම අවශ්‍ය කෙරේ. එසේ වුව ද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගතයේ දී බලපාන වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයන් වෙත ප්‍රමාණාත්මක ගැලපුමක් සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිඵල ඇතිකරවයි. මෙම සාධකවලට තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇතුළත් වේ.

1.11 ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපුමක් හටගන්නා සුවිශේෂී අවදානමක් සහිත අනාගතයට අදාළ ප්‍රධාන උපකල්පන හා අවිනිශ්චිතතාවය ඇස්තමේන්තු කිරීමේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහත විස්තර කෙරේ.

(අ) ***සාධාරණ අගය මත මූල්‍ය උපකරණ***

ශේෂ පත්‍රයේ වාර්තාවන මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය, සක්‍රිය වෙළඳපොලවල් වලින් ව්‍යුත්පන්න කළ නොහැකි විටක දී, තක්සේරු කිරීමේ විවිධ ශිල්පීය ක්‍රම භාවිතා එය නිර්ණය කරන අතර මීට වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආකෘතිය සහ/හෝ ගණිතමය තක්සේරු ක්‍රම ආදිය ඇතුළත් ය.හැකි අවස්ථාවලදී නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්තවලින් මෙම ආකෘති සඳහා යෙදවුම් ව්‍යුත්පන්න කරගන්නා නමුදු, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත නොමැති විටක දී, සාධාරණ අගය තහවුරු කිරීම සඳහා විනිශ්චයන් අවශ්‍ය කෙරේ.

මෙම සාධක සම්බන්ධයෙන් සිදුකරන උපකල්පනවල වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තාකළ සාධාරණ අගය මත බලපෑ හැකි ය.

(ආ) ***නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් තක්සේරු කිරීම***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 19 යටතේ දී උපචිත වගකීම් හා විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්වල ප්‍රවර්තන සේවා වියදම නිර්ණය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගැනීම අවශ්‍ය කෙරේ. මෙම ක්‍රමයේ අරමුණ වනුයේ, විවිධ ආයුගණක උපකල්පන ද සැලකිල්ලට ගෙන, සැලසුම යටතේ වන සෑම සේවකයෙකුගේම ප්‍රතිලාභ ඔවුන් විසින් උපචිත කරගනු ලබන විට දී වියදම් දැරීම යි. මෙහි දී යොදාගන්නා ප්‍රවේශය වනුයේ විශ්‍රාම යෑම, සේවයෙන් ඉල්ලා අස්වීම, මරණය සහ පූර්ණ දුබලතාවයක් හේතුවෙන් සෑම තනි සාමාජිකයෙකු වෙත ගෙවිය යුතු උපචිත අගය ප්‍රතිලාභය ඇස්තමේන්තු කිරීම යි. සෑම සාමාජිකයෙකු සඳහාම වූ ඇස්තමේන්තුගත උපචිත ප්‍රතිලාභ ඉන් අනතුරුව තක්සේරුකරණ දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණක වර්තමාන අගය ගණනය සඳහා එකතු කරනු ලැබේ. වෙනත් වචනවලින් කියහොත්, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක වර්තමාන අගය යනු සේවකයෙකුගේ වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේද සේවා කාලය හේතුවෙන් ප්‍රතිඵල වන බැඳීමක් පියවීම සඳහා අවශ්‍ය කරන අපේක්ෂිත අනාගත ගෙවීම්වල ආයුගණක වර්තමාන අගය යි.

2022/12/31 දිනැතිව සිදුකළ ආයුගණක තක්සේරුව මත පදනම්ව නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිර්ණය කරනු ලැබී ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශේෂ පත්‍ර දිනට ධාරණ අගය රු.27,771,814.00 (2021 - රු.68,224,580.00)

(ඇ) ***සාධාරණ අගය***

සාධාරණ අගය යනු දන්නා, කැමැත්තක් දක්වන පාර්ශව අතර එකී පාර්ශව සඳහා එසේ කිරීම සඳහා කිසිදු බලකිරීමක් සිදුනොවූ ආසන්න නුදුරු කාලයක ගනුදෙනුවක දී එකඟවන ලද ප්‍රතිෂ්ඨාවක අගය යි. යම් මූල්‍ය උපකරණයක් මුලින් හඳුනාගැනීමේ දී, එහි සාධාරණ අගය යනු ගෙවනු ලබන හෝ ලැබෙන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම යි. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වත්කමක සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ලංසු අගය වන අතර, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වගකීමක් සඳහා සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ඒ සම්බන්ධයෙන් ඉල්ලා සිටින මිල යි. කෙටි කාල සීමාවක් සහිත මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන වැනි මූල්‍ය උපකරණ සඳහා, මෙවැනි උපකරණවල ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගය වේ.

2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

ජංගම වත්කම් වශයෙන් ශේෂ පත්‍රයේ වර්ගීකරණය වන වත්කම් වනුයේ මුදල් හා බැංකු ශේෂ සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක දී හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත යන දෙකින් කෙටි කාල සීමාව තුළ මුදල් බවට පත්කළ හැකි දෑ ය.

2.2 මූල්‍ය උපකරණ

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

පසුව ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය හෝ ලාභ හෝ අලාභ අනුව සාධාරණ අගයට මිනුම්කරණය වන මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 අනුව පහත කාණ්ඩවලට වර්ග කෙරේ.

(අ) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන අස්තිත්වයේ ව්‍යාපාරික ආකෘතිය සහ

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ අනුව

වර්ගීකරණය කිරීම මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී කළමනාකාරිත්වය විසින් තීරණය කරන අතර ආයෝජන අත්පත් කරගනු ලැබුවේ කුමන කාර්යයකට ද යන්න මත එය රඳා පවතී.

2.2.2 වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිණුම්කරණය

(i) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කළ හැක:

(අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවාගැනීම අරමුණු වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ දී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගැනෙන මූල්‍ය වත්කම්, සහ

(ආ) හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ නිශ්චිතව දක්වන දිනවලදී මුදල් ප්‍රවාහ ඉහළ යෑමට හේතුවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි සහිත වීම.

(ii) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය වත්කමක් අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මිනුම්කරණය කළ හැක:

(අ) මූල්‍ය වත්කම් රඳවාගැනීම අරමුණු වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් අලෙවිය යන දෙකම ඔස්සේ සිය ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීම, සහ

(ආ) හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ නිශ්චිතව දක්වන දිනවලදී මුදල් ප්‍රවාහ ඉහළ යෑමට හේතුවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි සහිත වීම

(iii) ක්‍රමක්ෂය පිරිවැයට හෝ අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට දක්වා නොමැති මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්විය යුතු ය.

2.2.3 සාධාරණ අගය නිර්ණය කිරීම

ණය ගුණාත්මකතාවය, ද්‍රවශීලතාවය හා පිරිවැය සැලකිල්ලට ගෙන ගිවිසුම්ගතව එකඟ වූ මුදල් ප්‍රවාහ පදනම මත වර්තමාන අගය ආකෘතිය භාවිතා කරමින් ණය හා අත්තිකාරම් මෙන්ම වගකීම්වල සාධාරණ අගය නිර්ණය කෙරේ.

ධාරණ අගය අඩු කළ වෙළඳ ලැබිය යුතු හා ගෙවිය යුතු දෑවල ක්‍රමක්ෂය වෙන්කිරීම් ඒවායේ ආසන්නතම සාධාරණ අගයට උපකල්පනය කෙරේ.

2.2.4 ප්‍රතිවර්ගීකරණය

වත්කම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරික ආකෘතිය වෙනස් කරන අවස්ථාවේ සහ එම අවස්ථාවේ දී පමණක් සියලු බලපෑමට ලක්වන මූල්‍ය වත්කම්, යථොක්ත මූල්‍ය වත්කම් කාණ්ඩවලට අනුව නැවත වර්ගීකරණය කිරීම අවශ්‍ය කෙරේ.

2.2.5 හානිකරණය

(අ) *ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල ධාරණ අගය*

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වී ඇත්දැයි සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි තිබේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වීම හෝ හානිකරණ පාඩුව වනුයේ වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවීමක් හෝ සිදුවීම් වැඩි ගණනක් (‘හානි සිදුවීමක්’) සිදු වූ බවට හා එකී හානි සිදුවීම (සිදුවීම්) ඔස්සේ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවලට බලපෑමක් වන බවට විශ්වසනීය අයුරින් ඇස්තමේන්තු කළ හැකි විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වූ බවට සැලකෙන විෂය මූලික සාක්ෂි යටතට පහත සිද්ධි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ගැනෙන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ:

- නිකුත් කරන්නා හෝ ණයකරු සම්බන්ධිත සුවිශේෂී මූල්‍ය අසීරුතාවයක්;
- ගෙවීම් පැහැර හැරීම වැනි කොන්ත්‍රාත් ගිවිසුම් කඩකිරීම්;
- නිකුත් කරන්නා හෝ ණයකරු බංකලොත්බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් විය හැකි බවට වන සම්භාවිතාවය;
- මූල්‍ය අසීරුතා හේතුවෙන් සලකනු ලබන මූල්‍ය වත්කම සඳහා පවතින සක්‍රිය වෙළඳපොළ ඉවත්වීම; හෝ
- මූල්‍ය වත්කම් කාණ්ඩයක මුල් හඳුනාගැනීමේ සිට ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවල මිනුම්කරණය කළ හැකි අඩුවීමක් දැක්වෙන නිරීක්ෂණය කළ හැකි දත්ත,

වෙන් වෙන් වශයෙන් සුවිශේෂී වන මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් වෙන් වශයෙන් පවතීද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළමුව තක්සේරු කරනු ලැබේ. වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ මූල්‍ය වත්කමක් සඳහා සැලකිය යුතු හෝ නොවන හානිකරණ පවතී ද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට මණ්ඩලය විසින් තීරණය කළහොත්, එකී වත්කම සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුළ එය අන්තර්ගත කිරීම සහ සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම සිදුකරනු ලැබේ. හානිකරණය සඳහා වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ වත්කම් සඳහා හානිකරණ අඛණ්ඩව හඳුනාගත හැකි නම් එකී වත්කම් සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම තුළ අන්තර්ගත නොකෙරේ.

හානිකරණ අලාභ ණය හෝ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය පිරිවැයෙහි ධාරණ අගයට වැය දරා ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේ නම්, මූල්‍ය වත්කමෙහි මුල් බලාත්මක පොලී අනුපාතිකයට වට්ටම කළ වත්කමෙහි ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය(දරා ඇති අනාගත හානි ණය හැර) අතර වෙනස වශයෙන් හානියේ වටිනාකම මිනුම්කරණය කෙරේ. දීමනා ගිණුමක් භාවිතයෙන් වත්කමක ධාරණ අගය අඩු කෙරෙන අතර, හානි වන අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ. සාමූහික හානිකරණ ඇගයීමේ කාර්යය සඳහා මූල්‍ය වත්කම් සමාන ණය අවදානම් සහිත යන පදනමින් කාණ්ඩ කෙරේ.

ඉන් අනතුරුව කාල පරිච්ඡේදයක දී, හානිකරණ අලාභ අඩුවී එකී අඩුවීම විෂයනිශ්‍රිත වශයෙන් හානිකරණය හඳුනාගත් දිනය පසු සිද්ධියකට සම්බන්ධ කළහැකි නම් (වැඩිදියුණු වූ ණය ශ්‍රේණිගතවීම වැනි), පූර්ව වශයෙන් හඳුනාගත් හානිකරණ අලාභය, දීමනා ගිණුම ගැලපුම් කිරීමෙන් ප්‍රතිවර්තනය කෙරේ. එසේ ප්‍රතිවර්තනය කළ අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

(ආ) *මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය*

අනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය සඳහා බඳුන් නොවන අතර එකී වත්කම් වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය ආපසු ලබාගත නොහැකිබවට හැඟෙවෙන සිද්ධි හෝ වාතාවරණයන්ගේ වෙනස්වීමක් සිදුවන ඕනෑම අවස්ථාවක දී ක්‍රමක්ෂය සඳහා බඳුන්වෙන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවා යන අගයේ වටිනාකමට හානිකරණ පාඩුව හඳුනාගැනේ. ආපසු අයකරගත හැකි අගය යනු වත්කමක සාධාරණ අගයෙන් විකිණීම සහ භාවිතා අගය සඳහා පිරිවැය අඩුකළ පසු වැඩි අගය යි. හානිකරණය තක්සේරු කිරීම සඳහා, වත්කම් ඒවායේ වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ ඇති මට්ටම දක්වා අවම මට්ටමට කාණ්ඩ කෙරේ (මුදල් උත්පාදන ඒකක).

2.2.6 හඳුනාගැනීම අත්හැරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිද්දෙන් මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) පහත සඳහන් අවස්ථාවන්හි දී හඳුනාගැනීම අත්හැරේ:

- වත්කම් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත් වී තිබීම.
- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා ඇති විටෙක හෝ සමනය කරගැනීමේ ආකාරයක් වශයෙන් ලැබෙන මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීමට බැඳීමක් ඇති කරගෙන අවස්ථාවක දී; හෝ නැතහොත්

(අ) වත්කම්වල සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් මණ්ඩලය විසින් පවරා ඇති විටක, හෝ

(ආ) වත්කම්වලට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කම්හි පාලනය පවරා ඇති විටක.

මණ්ඩලය විසින් වත්කමක් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇතිවිට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා බැඳීමක් ඇතිකරගත් විට, සහ වත්කම්වලට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කම්හි පාලනය පවරා ඇති විටක, වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් මණ්ඩලයේ අඛණ්ඩ සහභාගිත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලැබේ. එවැනි අවස්ථාවක දී, මණ්ඩලය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. මණ්ඩලය විසින් රඳවා ගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයක පදනමකින් පවරනු ලැබූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනිනු ලැබේ. පවරනු ලැබූ වත්කමක් සඳහා ඇපයක ආකාරයෙන් පවත්නා අඛණ්ඩ සහභාගිත්වයක් වත්කමෙහි මුල් ධාරණ අගයේ අවමය හා මණ්ඩලය විසින් ආපසු ගෙවීම අවශ්‍ය විය හැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම අගය අනුව මිනිනු ලැබේ.

2.2.7 මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරනුයේ, එසේ එම අගයන් හිලව් කිරීම සඳහා මණ්ඩලයට නීතිමය අයිතියක් පවතී නම් හා ශුද්ධ පදනමක් මත පියවීම හෝ එක්වර වත්කම් උපලබ්ධිවීම හා වගකීම් පියවීම සඳහා අපේක්ෂා කරන්නේ නම් පමණි.

2.3 දේපළ, පිරියත හා උපකරණ

2.3.1 හඳුනාගැනීම හා මිනුම්කරණය

දේපළ, පිරියත හා උපකරණ අයිතම සමුච්චිත ක්ෂයකිරීම් සහ හානිකරණයන් අඩුකර පිරිවැය හෝ තක්සේරු අගයට ගිණුම්ගත කෙරේ. මෙම පිරිවැයට වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් ද ඇතුළත් වේ. ස්වයං- නිර්මිත වත්කමක පිරිවැයට එය සෑදීම සඳහා යොදාගත්ද්‍රව්‍යවල පිරිවැය හා සෘජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වන ක්‍රියාකාරී තත්ත්වයට රැගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන වෙනත් පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණවල ප්‍රතිංසස්කරණය හෝ වත්කම්වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා අලුත්වැඩියා හෝ නඩත්තු කිරීම සඳහා වන වැය දැරීම් වියදම් වශයෙන් ඒවා වැය කරන අවස්ථාවේ දී හඳුනාගැනේ.

සක්‍රිය වෙළඳපොළ තුළ සැලකිය යුතු ආකාරයෙන් සිදුවූ අගය ඉහළ යෑම හේතුවෙන් 2022 වර්ෂය සඳහා මෝටර් වාහන ප්‍රත්‍යාගණනය සිදුකරන ලදී. ප්‍රත්‍යාගණනය හේතුවෙන් ඇති වූ ලාභය වූ රු.85,996,926.67ක් ප්‍රත්‍යාගණන සංචිතය වෙත බැර කරන ලදී.

2.3.2 පසුකාලීන පිරිවැය

ප්‍රධාන පරීක්ෂා කිරීම් හා කොටස් කර පිරික්සුම් ද ඇතුළුව දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන වියදම් වෙන්ව ගිණුම්ගත කරන අතර, කල්බදු කාල සීමාව තුළ දී ප්‍රාග්ධනීකරණය කර කපා හැරේ. අනෙකුත් පසුකාලීන පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනුයේ එම කොටස තුළ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික වාසි මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට හා එය විශ්වාසනීය අයුරින් මිනුම්කරණය කළහැකි නම් පමණි. දේපළ, පිරියත හෝ උපකරණවල දෛනික සේවා කිරීම් වැය දැරූ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

2.3.3 ක්ෂයවීම්

දේපළ, පිරියත හා උපකරණවල වැය/ තක්සේරුව මත සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂයකිරීම් සඳහා වෙන්කිරීම් ගණනය කෙරේ. ඉඩම් හැර සියලුම දේපළ, පිරියත හා උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය මුළුල්ලේ පහත දැක්වෙන ප්‍රතිශතවලට අදාළ වන අගයවල් වලින් කපා හැරීම සඳහා වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

අවුරුදු 10ට වඩා නොපැරණි මෝටර් වාහන	10%	අවුරුදු 10ට වඩා පැරණි මෝටර් වාහන	20%
පරිගණක	20%		
පරිගණක උපකරණ	25%	ටෙලිවිෂන් උපකරණ	10%
දුරකතන ස්ථාපනය කිරීම්	20%	ගෘහභාණ්ඩ හා සවි කිරීම්	10%
නේවාසික දුරකතන	10%	කාර්යාලීය උපකරණ	10%
PABX පද්ධතිය	10%	KIOSK පද්ධතිය	20%
අනෙකුත් උපකරණ	33 1/3%		

මිලදී ගනු ලැබූ දිනයේ සිට ආරම්භ වන පරිද්දෙන් සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂය කිරීම් සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 16 හි දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ දී ලබාගත හැකි ප්‍රශස්තතම තොරතුරු මත පාදකව දේපළ, පිරියත හා උපකරණවල ආර්ථික ජීව කාලය යළි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් දේපළ, පිරියත හා උපකරණ සඳහා ක්ෂය කිරීමේ අනුපාතය වෙනස්විය. වත්කම්වල ඵලදායි ජීවකාලය වෙනස්වීමේ මගින් ඇති වූ ප්‍රතිඵලය 2012 වර්ෂයේ සිට ඉදිරියට වන පරිද්දෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කරන ලදී.

2.3.4 හඳුනාගැනීම අත්හැරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීම හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරක අවස්ථාවේ දී ඒවා හඳුනා ගැනීම අත්හරිනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණයක් බැහැර කිරීමේ දී ඇතිවන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ එහි විකුණුම් ආදායම හා වත්කමේ ධාරණ අගය අතර වෙනස වශයෙන් වන අතර එම ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදී ම, එහි ස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ ද යන්න නිර්ණය කරගැනීම සඳහා මණ්ඩලය විසින් එහි ස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, හානිකරණ පාඩුවේ ප්‍රමාණය (එසේ පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ ආපසු අය කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ. තනි වත්කමක ආපසු කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කිරීම සිදුකළ නොහැකි නම්, එකී වත්කම අයත්වන මුදල්-උත්පාදන ඒකකය සඳහා කරගත හැකි වටිනාකම නිර්ණය කෙරේ.

සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි නම්, වත්කම් තනි මුදල්-උත්පාදන ඒකකවලට ද වෙන්කළ හැකි ය. එසේ නැත්නම් එකී වත්කම් කුඩාතම මුදල්-උත්පාදන ඒකක සමූහයකට වෙන්කරන අතර එහිදී සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි ය.

ආපසු අයකර ගත හැකි අගය යනු විකුණුම් පිරිවැය හෝ භාවිත අගය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය යි. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය හා වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතියක් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක (හෝ මුදල් ජනන ඒකකයක) ආපසු අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු ගත කරයි නම්, වත්කමේ (හෝ මුදල් ජනන ඒකකයේ) ධාරණ අගය එහි ආපසු අයකර ගත හැකි වටිනාකමට අඩු කරනු ලැබේ. හානිකරණ පාඩුව ප්‍රත්‍යාගණනිත අඩු වීමක් ලෙස සැලකෙන අවස්ථාවක් වන අදාළ වත්කම ප්‍රත්‍යාගණනිත වටිනාකමට දක්වන්නේ නැතහොත්, හානිකරණ පාඩුව වහාම ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

2.3.6 පුනරාවර්තන වියදම් (විවිධ වත්කම්) ලෙස වාර්තා කෙරෙන ප්‍රමාණාත්මක නොවන ජංගම නොවන වත්කම්වල පිරිවැය)

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 16) ඔස්සේ "අමතර කොටස් හා සේවා කිරීමේ උපකරණ තොග ලෙස දැක්වෙන අතර භාවිතයට ගන්නා විට ලාභ හෝ අලාභවල දී හඳුනාගනී " ලෙසින් මහ පෙන්වයි.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු පිරිවැය/ තොරතුරු තාක්ෂණයට අදාළ අමතර කොටස් ආදිය ඇතුළුව සියලු කුඩා වටිනාකම්වල වැය අයිතමයන් විවිධ වත්කම්වල පිරිවැය ලෙස එම පිරිවැය දරන අවස්ථාවේ ගිණුම් ගත කිරීම සිදුකරනු මිස, ස්ථීර වත්කම්වල අගය සමඟ සංසන්දනය කිරීමේ දී ප්‍රමාණවත් නොවන හෙයින් ස්ථීර වත්කම්වල පිරිවැය කොටසක් ලෙස ගිණුම්ගත නොකෙරේ.

2.4 ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආශ්‍රිත සමාගමක ආයෝජනය මුලින් පිරිවැයට හඳුනාගන්නා අතර අත්පත් කරගත් දිනයෙන් පසු ආයෝජිතයාගේ ලාභයෙන් හෝ අලාභයෙන් මණ්ඩලයේ පංගුව හඳුනාගැනීම සඳහා ධාරණ අගය ඉහළ හෝ පහළ දැමීම සිදුවේ (හිමිකම් ක්‍රමය). ධාරණ අගයට සිදුකරන ගැලපුම් (දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් හෝ විදේශ විනිමය හුවමාරු වෙනස්කම් හේතුවෙන් ඇතිවන වෙනස්වීම්) ආයෝජිතයා වෙත මණ්ඩලයේ සමානුපාතික අයිතිය යටතේ 2013 වර්ෂයේ සිට ඉදිරියට හඳුනාගනු ලබන අතර මෙය පැන නඟිනුයේ ආයෝජිතයාගේ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල වෙනස්වීම් හේතුවෙනි.

2.5 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට අදාළ සේවා විභවයෙන් අපේක්ෂිත ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම්; සහ

වත්කමෙහි පිරිවැය හෝ සාධාරණ අගය විශ්වාසනීය අයුරින් මැනිය හැකි නම්

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනී.

SLPSAS-20 ට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම සඳහා මණ්ඩලය විසින් පිරිවැය ආකෘතිය යොදා ගනී. පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ඵලදායී ජීව කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමකින් ක්ෂය ප්‍රමාණ වෙන් කෙරේ. අදාළ වන ක්‍රමක්ෂය අනුපාතිකය 25% කි.

2.6 තොග

පිරිවැය හෝ ශුද්ධ ආපසු ලබාගත හැකි අගයෙන් අඩු අගයට සියලුම තොග අගය කෙරේ. පළමුව ලැබී ඇති තොග පළමුව නිකුත් කළ යුතුය (FIFO) මත පදනම්ව පිරිවැය නිර්ණය කෙරේ.

2.7 අනෙකුත් වත්කම්

අනෙකුත් ණයකරුවන් හා ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු, පූර්ව ගෙවීම්, ලැබිය යුතු බදු අනෙකුත් වත්කම් යටතට ඇතුළත් වේ.

(අ) <u>අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවූ වියදම්</u>
එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා වාසි හා සබඳතාවයක් සහිත යැයි සැලකෙන වියදම් අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාලයට සමානුරූපී ආකාරයෙන් එයට අදාළ වන කාල සීමාව මුළුල්ලේ එවැනි වියදම් කපා හැරේ.

(ආ) <u>අනෙකුත් ණයකරුවෝ</u>
හානිකරණ අලාභයෙන් පිරිවැය අඩුකර අනෙකුත් ණයකරුවන් හඳුනාගනී.

(ඇ) <u>ලැබිය යුතු වැට් බදු</u>
ලැබිය යුතු වැට් මුදල් පිරිවැයට හඳුනාගනී.

2.8 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් සහ පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණ බවට පරිවර්තනය කළ හැකි හා වටිනාකමේ වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය යුතු අවදානමකට යටත්වන කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. කෙටි කාලීන මුදල් බැඳීම් සපුරා ගැනීම සඳහා මේවා පවත්වා ගනී.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් හා ගෙවීමට ඇති බැංකු අයිරා හැර බැංකුවල ඇති ශුද්ධ තැන්පතු ප්‍රමාණය වේ. කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන එනම්, අත්පත් කරගත් දිනයේ සිට මාස තුන හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සැලකේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ දී, බැංකු අයිරා දැක්වෙනුයේ ණය ගැනුම් ඇතුළත ජංගම වගකීම් යටතේ ය.

2.9 මූල්‍ය වගකීම්

2.9.1 මූල්‍ය වගකීම් වර්ගීකරණය

පහත සඳහන් මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පසු අවස්ථාවේ දී ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කළ වශයෙන් හඳුනාගැනේ:

(අ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම්, එවැනි වගකීම්, වගකීම් වන ව්‍යුත්පන්නයන් ද ඇතුළුව පසු අවස්ථාවේ දී සාධාරණ අගයට මිනුම්කරණය කළ යුතු ය.

(ආ) මූල්‍ය වත්කමක් පවරනු ලබන අවස්ථාවේ දි හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් නොලබනවිට හෝ අඛණ්ඩ සහභාගී ප්‍රවේශය අදාළ වීමෙන් හට ගන්නා මූල්‍ය වගකීම්.

(ඇ)මූල්‍ය ඇපකරු කොන්ත්‍රාත්

(ඈ) වෙළඳ පොළ පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් යටතේ ණයක් සැපයීම සඳහා බැඳීම්.

ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 විෂය පථය තුළ වන මූල්‍ය බැරකම් අදාළ වන පරිද්දෙන් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම් හෝ ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී මණ්ඩලය විසින් එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය නිර්ණය කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

2.9.2 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම්වලට උපචිත වියදම් ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ ඓතිහාසික අගයට සඳහන් කරන අතර එය ඒවායේ සාධාරණ අගය වශයෙන් සැල කේ.

2.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී. යම් ප්‍රදානයක් වියදමකට අදාළ වේ නම්, එහි වියදම සමඟ අනුරූපී වීමට අවශ්‍ය කාලසීමාව මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනාගන්නා අතර, මෙය ක්‍රමානුකූල පදනමකින් හානිපූරණය සඳහා අපේක්ෂිත ය.

වත්කම්වලට අදාළ ප්‍රදාන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත වශයෙන් හඳුනාගන්නා අතර වත්කමෙහි ප්‍රයෝජ්‍ය කාලය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත *LKAS 20* - රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ සහාය අනාවරණය කිරීම ප්‍රකාරව, රජයේ අරමුදල් භාවිතාකරමින් මණ්ඩලයේ සංවර්ධන අයවැය යටතේ මිලදී ගත් ස්ථාවර වත්කම්වල පිරිවැය, රජයේ ප්‍රදාන ගිණුමට මාරු කරන අතර ඒවයේ ඵලදායී ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ (ක්ෂය අනුපාතිකයට සමානව).

මණ්ඩලය නිර්මාණය කරන අවස්ථාවේ පහත ආයනවලින් මණ්ඩලයට පැවරුනු වත්කම් සහ මණ්ඩලය වෙත ඉන් අනතුරුව මිලදී ගත් වත්කම් රජයේ ප්‍රදානවල වටිනාකමින් පිළිබිඹු වේ.

රජයේ දායකත්වය	-	රු.	7,904,002.00
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දායකත්වය	-	රු.	2,110,282.00
රජයේ ප්‍රදාන - මොටර් වාහන	-	රු.	5,832,300.00
රජයේ ප්‍රදාන - අනෙකුත්	-	රු.	7,187,835.00
එකතුව	-	රු.	23,034,419.00

2.11 සේවක ප්‍රතිලාභ

නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ආඥා පනත් හා රෙගුලාසිවලට අනුකූලව සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) ට සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වයන්ට සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවකයන්ගේ දළ වැටුපෙන් නිශ්චිත දායකත්වයන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙත ගෙවනු ලබන අතර ඊට වැඩියෙන් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් හැරුන විට පශ්චාත් රැකියා සැලසුම් වේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව, පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. බැඳීම් හා වියදම් මිනුම්කරණය සඳහා ආයුගණක උපකල්පන අවශ්‍ය කරන හෙයින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණය සංකීර්ණ වන අතර, ආයුගණක ලාභ හෝ පාඩු සඳහා භව්‍යතාවයක් පවතී. තවද,

බැඳීම් වට්ටම් ගත පදනමින් මිනුම් කරනු ලබන අතර මීට හේතුව වනුයේ සේවකයා විසින් අදාළ සේවය ලබා දීමෙන් වසර ගණනාවක් ගෙවී යාමෙන් අනතුරුව ඒවා පියවීම සිදුවීම යි.

ව්‍යත්තීය උපදේශක සමාගමක් වන ස්මයිල්ස් ග්ලෝබල් පුද්ගලික සමාගම විසින් ආයුගණක තක්සේරුකරණය සිදුකරනු ලැබේ. වට්ටම් අනුපාතිකය 18%ක්, වැටුප් උද්ධමන අනුපාතිකය 2%ක්, මරණ අනුපාතිකය A67/70 **Ult tables**, ආපසු ගැනීමේ අනුපාතිකය 5%ක් වශයෙන් මෙම සමාගම විසින් උපකල්පන සිදුකර තිබේ.

2.12 ආදායම් බදු

1979 අංක 18 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව,

(අ) මණ්ඩලයේ ලාභ සහ ආදායම; සහ

(ආ) අරමුදලින් මණ්ඩලය විසින් සහනාධාරයක් හෝ ආධාර මුදලක් වශයෙන් යම් තැනැත්තෙකුට ගෙවනු ලබන මුදලක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

2.13 ආදායම් හඳුනාගැනීම

අ. රජයේ ප්‍රදාන

රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් මෙමගින් නියෝජනය වේ. පුරෝකථනය කළ මුදල් ප්‍රවාහ අවශ්‍යතා මත පදනම්ව, මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත අවශ්‍ය අරමුදල් සපයනු ලැබේ. එබැවින්, මෙමගින් මණ්ඩලය මගින් ලැබූ ප්‍රදානයකට අදාළ වියදම් නියෝජනය වන අතර මෙය සාධාරණ අගයට හඳුනාගැනේ.

ආ. අනෙකුත් ආදායම්

අදාළ සේවා ඉටුකළ කාල සීමාව තුළ පැනනගින ඉන්වොයිස් ප්‍රකාරව සේවා හා තොරතුරු ලබාදීමෙන් ලැබෙන ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.

ඇ. පොලී ආදායම

පොලී දරන සියලුම මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම සළුල පොලී අනුපාතික ක්‍රමවේදය භාවිතා කරමින් වාරිකය නැවත ගෙවනු ලබන අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ඈ. ලාභාංශ ආදායම

ගෙවීම ලැබීමට මණ්ඩලයට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

2.14 වියදම් හඳුනාගැනීම

සියලු වියදම් දුන් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කරන අතර එකී වියදම් අදාළ වන කාල පරිච්ඡේදය තුළ හඳුනාගනී. ක්ෂයවීම් කාලය වෙනස් කිරීමෙන් අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලයේ වෙනස්වීම් හෝ වත්කම් තුළ ගැබ් වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය සඳහා අපේක්ෂිත රටාව සැලකිල්ලට ගනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනසක් ලෙස එය සලකනු ලැබේ.

2.15 ණය ගැනීම් පිරිවැය

ණය ගැනීම් පිරිවැය යනු අරමුදල් ණයට ගැනීමේ දී මණ්ඩලය විසින් දරන පොළිය සහ අනෙකුත් පිරිවැය යි. ණය ගැනීම් පිරිවැය එකී පිරිවැය දරන කාලසීමාව තුළ පිරිවැයක් වශයෙන් හඳුනාගනී.

2.16 විදේශීය මුදල් පරිවර්තනය කිරීම/ ගනුදෙනු

ගනුදෙනු සිදුකරන අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකය මත, ක්‍රියාකාරී මුදල් ඒකකය හැර වෙනත් මුදල් ඒකකවලින් සිදුකරන සියලු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් වාර්තාකරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මුදල් වත්කම් හා වගකීම් ශේෂ පත්‍ර දිනයට බලාත්මක විනිමය අනුපාතික යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය නොවන වත්කම් හා වගකීම් එකී ගනුදෙනු සිදුවූ දිනයේ පවතින විනිමය අනුපාතිකය භාවිතාකරමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මුදල් අයිතම පියවන අවස්ථාවේ දී සහ මුදල් අයිතම නැවත පරිවර්තනය කිරීමේදී හටගන්නා විනිමය අනුපාතික වෙනස්කම් එකී වෙනස්කම් හටගන්නා වර්ෂයේ දීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

2.17 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

මණ්ඩලයට එහි ආශ්‍රිත සමාගම වන ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ආශ්‍රිත පාර්ශව සබඳතාවයක් ඇත. මණ්ඩලය විසින් එය භාවිතා කරන ඉඩකඩ සඳහා මාසික කුලියක් ලබාදෙන අතර රජයේ තක්සේරුකරු විසින් සිදුකරන තක්සේරුව අනුව ආශ්‍රිත සමාගම වෙත ශ්‍රවණාගාරය කුලියට ගැනීමේ ගාස්තු ද ගෙවනු ලැබේ. ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් නම්කරන ලද අධ්‍යක්ෂවරු වශයෙන් සභාපති හා ප්‍රධාන විධායක - සුරේෂ් ද මෙල් මහතා සහ මණ්ඩලයේ නීති නිලධාරීනි - ඩී.ටී.විජේරත්න මිය කටයුතු කරනු ලැබේ. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) - එස්.ආර්.පීඉන්ද්‍රකීර්ති මහතා සහ මූල්‍ය අධ්‍යක්ෂ - කේ.ඩී.පෙරේරා මහතා 2022 වර්ෂයේ දී ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කෙරිනි. 2022 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හතරක් පැවැත්වුණු අතර එක් රැස්වීම් වාරයක් සඳහා රු.10,000ක සහභාගිත්ව දීමනාවක් ගෙවා තිබුණි.

ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 (LKAS- 14) හි ආශ්‍රිත පාර්ශව අනාවරණය කිරීම් ප්‍රකාරව, ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස යනු මණ්ඩලයේ සැලසුම්, මෙහෙයැවීම හා ක්‍රියාකාරකම් පාලනය සඳහා අධිකාරී බලට හා වගකීම දරන පිරිස් ය.

වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් - මාලනී බැද්දේගමගේ මහත්මිය සභාපතිනිය වශයෙන් හා අධ්‍යක්ෂ (මුදල්) - කේ.ඩී.පෙරේරා මහතා කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් හතු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය (MDTC) සඳහා පත්කර තිබේ. රු.4,000/- මාසික දීමනාවක් කළමනාකරණ අධ්‍යක්ෂ වෙත ගෙවන ලදී. රජය විසින් සිය අතුරු අයවැය -2022 යටතේ (අයවැය යෝජනා අංක 32) ඇසුරුම් කර්මාන්තයේ ප්‍රවර්ධනය හා ප්‍රයෝජනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) යළි සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD), ශ්‍රී ලංකා කොයිරුගේටඩ් කාටන් මැනියුෆැක්චරස් සංගමය (LCCMA) හා ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (SLIP) යන ආයතනවලින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය වේ.

ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ (NPC) සභාපති වශයෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සුරේෂ් ද මෙල් මහතා පත්වූ අතර අපනයන සංවර්ධන මණ්ඩලයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් පී.වී.ඒ.එම්.බැද්දේගමගේ මහත්මිය අපනයන සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. අධ්‍යක්ෂ මූල්‍ය - කුසල් ඩී.පෙරේරා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ ගණකාධිකාරි වශයෙන් පත්කරන ලදී.

2.18 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

අධ්‍යක්ෂවරු විසින් සිද්ධි සමීපව අධීක්ෂණය කර යෝග්‍ය පරිද්දෙන් ශේෂ පත්‍ර දිනයෙන් පසු ප්‍රමාණාත්මක සිද්ධිවලට අදාළව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යතානුකූලව ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදුකරනු ලැබේ.

2.19 අසම්භව්‍ය බැරකම්

අ) අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය අනාගත බැඳීමක් හෝ අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය වර්තමාන බැඳීමක් පැවතිය ද, මෙම ගෙවීම් ද්විත්වයම සිදුකළ හැකි දැයි අවිනිශ්චිත හෝ වටිනාකම සාධාරණ අයුරින් ඇස්තමේන්තු කළ නොහැකි විට දී අසම්භව්‍ය බැරකම් අනාවරණය කෙරේ.

ආ) මණ්ඩලය සමග සිදුකළ විවිධ ගනුදෙනුවලට අදාළව මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල් යළි ලබාගැනීම සඳහා මණ්ඩලය විසින් පාර්ශව 17 කට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. මෙම ගනුදෙනුවල විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල සටහන් අංක 24 යටතේ සඳහන් කර තිබේ.

2.20 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ට අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ.

මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු, පූර්ව හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් විලම්භනය හෝ උපචිත වීම් හෝ මුදල් ප්‍රවාහ මත ආයෝජන හෝ මූල්‍යයන ආශ්‍රිත ආදායම් හෝ වැය අයිතමවල බලපෑම් මගින් ගැලපුම් කළ ලාභය හෝ අලාභය වක්‍ර ක්‍රමය ඔස්සේ අනාවරණය වේ.

		සටහන	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.12.31 රු.
(3)	**ආදායම**			
	ලැබූ භාණ්ඩාගාර අරමුදල්		351,522,100	489,162,726
	සංවර්ධන කාර්යයන් වෙනුවෙන් අපනයනකරුගේ දායකත්වය		118,951,875	21,546,050
	ඊ-සේවා ආදායම		650,303	319,548
	EDB e-වෙළඳ පොළ		114,487	166,632
	සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු		5,963,251	3,946,615
	පොත් අලෙවිය		218,735	29,260
	ස්ථාවර වත්කම් අලෙවිය		415,449	-
	විවිධ ආදායම්	**(3.1)**	630,379	418,286
			478,466,579	**515,589,117**
(3.1)	**විවිධ ආදායම්**			
	අමිශ්‍රිත සිලෝන් කුරුඳු සන්නාමය ලියාපදිංචි කිරීම		221,567	342,996
	නැවත ආපසු නොලැබන තැන්පතු කිරීම්		372,000	56,000
	අනෙකුත් විවිධ ආදායම්		36,812	19,290
			630,379	**418,286**
(4)	**අනෙකුත් ආදායම්**			
	පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය		1,864,859	1,931,698
	(අඩුකළා/එකතු කළා: කාර්ය මණ්ඩල පිරිවැය -(IFRS ගැලපුම්)		(3,656,960)	3,259,226
	sකාර්ය මණ් ඩල ණය මත ආදායම		(1,792,101)	5,190,924
	ලාභාංශ ආදායම		90,668,264	40,345,573
	ආයෝජන මත පොලී ආදායම		5,872,896	-
	නෙකුත් විවිධ වියදම්		711,215	1,782,733
	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		6,113,619	7,364,148
			101,573,893	**54,683,378**

	සටහන	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2021.12.31 රු.
(5) ආයෝජන හා අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන්කිරීම්			
හවුල් ආයෝජනයට අදාළ වෙන් කිරීම් ප්‍රතිවර්ත්‍ය කිරීම (12.1 සටහන යටතේ ඇති 2021.12.31 ට (රු. 136,416,682)ක් වූ හානිකරණ වෙන්කිරීම් සහ 2022.12.31 දිනට කොටස්වල අගය වැඩිවීම (රු.7,847,812) අතර වෙනස)		(144,264,494)	-
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වෙනුවෙන් හානිකරණ වෙන් කිරීම් (14 වන සටහන යටතේ දක්වා ඇති වෙළඳ හා ලැබිය යුතු දෑ වෙනුවෙන් දිගු කාලයක් හිඟ සිටි මුදල් සඳහා හානිකරණ වෙන්කිරීම්)		6,559,557	-
සේවා සඳහා තැන්පතුවලට එරෙහිව හානිකරණ වෙන් කිරීම් (15 වන සටහන යටතේ දක්වා ඇති)		884,949	-
අපනයන ණයවලට අදාළව වෙන්කිරීම් ප්‍රතිවර්ත්‍ය කිරීම් (14 වන සටහන යටතේ දක්වා ඇති)		(626,500)	(408,000)
		(137,446,488)	**(408,000)**
(6) අපනයන සංවර්ධන වියදම්			
නිෂ්පාදිත/ වෙළඳපොළ සංවර්ධන වැඩසටහන්		6,683,140	49,370,751
අපනයන වෙළඳපොළ ප්‍රවර්ධන - විදේශ		131,723,463	46,579,169
අපනයන වෙළඳපොළ ප්‍රවර්ධන - දේශීය		4,232	1,383,924
Expo 2020 ඩුබායි ප්‍රදර්ශනය		770,087	33,570
දේශීය වෙළඳ පොළවල්		-	732,806
ප්‍රතිපත්ති හා සැලසුම් වියදම්		73,818	270,625
ප්‍රාදේශීය සංවර්ධන වියදම්		1,737	135,218
වෙළඳ තොරතුරු හා සේවා වියදම්		6,584,201	11,166,892
සිලෝන් කුරුඳු සන්නාමය		-	1,400
		145,840,678	**109,674,355**

		සටහන	ශ්‍රී.ලං.ගි.පු **31.12.2022** රු.	ශ්‍රී.ලං.ගි.පු **31.12.2021** රු.
(7)	**පරිපාලන වියදම්**			
	වැටුප් හා වේතන		141,071,880	145,265,482
	අතිකාල සහ නිවාඩු දින වැටුපු		8,207,198	9,340,903
	ප්‍රසාද දීමනා		3,303,175	2,823,364
	සේවක අර්ථසාධක අරමුදල		18,180,664	20,147,067
	සේවක භාරකාර අරමුදල		3,636,079	4,029,414
	පාරිතෝෂික		(24,525,105)	9,196,815
	විශේෂ දීමන වියදම් දීමනාවෙහි නොගෙවූ හිඟ මුදල්		6,400,487	-
	සේවක සුභසාධන කටයුතු		12,623,855	12,221,599
	වෛද්‍ය හා විවේක නිවාඩු සඳහා මුදල් ලැබීම		8,740,071	9,843,534
	බඳවාගැණීමේ ගාස්තු		182,550	2,156,294
	විදුලිය		15,209,402	17,038,217
	ජලය		782,198	627,862
	නීති සහ අනෙකුත් වෘත්තීය ගාස්තු		71,388	522,703
	වෙළඳ ප්‍රචාරණය		624,896	558,906
	ආරක්ෂාව		2,316,599	2,467,090
	විගණන ගාස්තු		1,410,000	990,000
	මුද්‍රණ ගාස්තු		150,955	439,607
	ප්‍රවාහන හා ගමන් වියදම් ගාස්තු		26,741,733	14,549,817
	විනෝදාස්වාද		147,802	87,822
	අනෙකුත් පොදු වියදම්		303,211	93,749
	කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය		3,519,821	4,075,746
	අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු හා වියදම්		660,050	856,700
	කාර්යාල උපකරණ නඩත්තුව		1,600,556	1,540,529
	කුලිය		88,852,626	79,983,925
	ඉන්ධන සහ ස්නේහක		8,383,550	3,297,438
	වාහන අලුත්වැඩියාව හා නඩත්තුව		3,703,721	3,343,848
	පුද්ගලික පිරිස් කුලියට ගැනීමේ ගාස්තු		1,429,778	6,434,741
	සන්නිවේදන හා දායක මුදල්		7,191,335	6,570,343
	ISO තත්ව සහතික ක්‍රියාත්මක කිරීමේ වියදම්		-	573
	ස්ථාවර වත්කම් ක්ෂය වීම		10,586,350	8,951,192
	අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		67,500	312,013
	දේශීය පුහුණු		870,182	532,671
	විදේශීය පුහුණු		761,252	-
	සැපයුම් අවශ්‍යතා		3,280,807	3,905,884
	රක්ෂණ හා රක්ෂණ අලුත් කිරීම		189,950	216,212
	විවිධ වත්කම් මිලදී ගැනීම		152,871	-
			356,829,387	**372,422,060**
(8)	**මූල්‍ය පිරිවැය**			
	මුද්දර ගාස්තු		59,882	91,144
	මූල්‍ය ගාස්තු		133,224	206,980
			193,106	**298,124**

(9) දේපළ, පිරියත හා උපකරණ

(9.1) පිරිවැය

2021/01/01 දිනට ශේෂය	වත්කම්	2022/01/01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	ගැලපුම්	ඉවත් කිරීම්	2022.12.31 දිනට ශේෂය
71,726,450	මෝටර් වාහන	71,726,450	-	21,306,900	(33,350)	-	93,000,000
45,967,748	පරිගණක	46,928,648	1,265,000	-	(20,502,687)	698,137	26,992,824
2,027,006	පරිගණක උපකරණ	2,376,546	51,000	-	(169,546)	945,848	1,312,152
735,930	Kiosk පද්ධතිය	735,930	-	-	-	-	735,930
4,816,845	රූපවාහිනී උපකරණ	4,816,845	2,086,700	-	(400)	2,706,849	4,196,296
143,174	PABX උපකරණ	143,174	-	-	-	-	143,174
1,799,055	දුරකතන ස්ථාපිත කිරීම්	1,849,955	-	-	53,872	-	1,903,827
16,610,459	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	16,656,554	13,200	-	(1,052,850)	94,587	15,522,317
18,699,075	කාර්යාලීය උපකරණ	19,358,914	-	-	(4,496,287)	1,686,553	13,176,074
34,740	අනෙකුත් උපකරණ	34,740	-	-	-	-	34,740
69,240	ගෘහස්ත දුරකතන	69,240	-	-	-	-	69,240
162,629,723		**164,696,996**	**3,415,900**	**21,306,900**	**(26,201,248)**	**6,131,974**	**157,086,574**

(9.2) ක්ෂය කිරීම්

2021/01/01 දිනට ශේෂය	ක්ෂය කිරීම්	2022/01/01 දිනට ශේෂය	පූර්ව වර්ෂ සඳහා ගැලපුම්	වර්ෂය සඳහා අයකිරීම්	ගැලපුම්	ඉවත් කිරීම් සඳහා ක්ෂය කිරීම්	2022/12/31 දිනට ශේෂය
58,336,288	මෝටර් වාහන	62,158,933	-	7,366,207	(64,705,140)	-	4,820,000
39,185,058	පරිගණක	41,564,551	-	2,025,168	(20,502,687)	698,137	22,388,895
1,612,303	පරිගණක උපකරණ	1,866,530	-	245,228	(210,946)	945,848	954,964
601,010	Kiosk පද්ධතිය	735,930	-	-	-	-	735,930
4,676,653	රූපවාහිනී උපකරණ	4,907,364	-	221,594	(400)	2,706,849	2,421,709
79,909	PABX උපකරණ	94,226	-	(11,902)	-	-	82,324
1,657,717	දුරකතන ස්ථාපිත කිරීම්	1,715,396	-	-	57,997	-	1,773,393
10,581,208	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	11,458,201	-	153,346	(862,646)	94,587	10,654,314
16,262,519	කාර්යාලීය උපකරණ	17,430,617	-	585,624	(4,586,532)	1,686,553	11,743,156
27,155	අනෙකුත් උපකරණ	33,655	-	1,085	-	-	34,740
63,632	ගෘහස්ත දුරකතන	69,240	-	-	-	-	69,240
133,083,452		**142,034,643**	**-**	**10,586,350**	**(90,810,354)**	**6,131,974**	**55,678,665**

	ලියා හරින ලද අගය	*2022*	*2021*
162,629,723.00	පිරිවැය	157,086,574	164,696,996
(133,083,452.00)	උපචිත: ක්ෂය කිරීම්	(55,678,665)	(142,034,643)
29,546,271.00	ලියා හරින ලද අගය	**101,407,909**	**22,662,353**

(9.3) වාර්තා කරන දිනය වන විට ද තවමත් භාවිතයේ ඇති සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය පහත පරිදි වේ.

	2022.12.31	2021.12.31
	රු.	රු.
පරිගණක උපකරණ	606,112	1,053,894
පරිගණක	17,554,884	33,249,894
PABX පද්ධතිය	65,549	65,549
පරිගණක මෘදුකාංග	3,539,600	4,145,281
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	14,280,939	14,026,131
KIOSK පද්ධතිය	735,930	-
කාර්යාලීය උපකරණ	6,812,814	12,639,226
අනෙකුත් උපකරණ	15,240	15,240
ගෘහස්ත දුරකතන	69,240	69,240
දුරකතන ස්ථාපිත කිරීම්	1,600,202	1,540,830
රූපවාහිනී උපකරණ	1,411,695	4,114,694
	46,692,205	**70,919,979**

(10) අස්පෘශ්‍ය වත්කම්

(10.1) පිරිවැය

2021/01/01 දිනට ශේෂය	වත්කම්	2022/01/01 දිනට ශේෂය	එකතු කළ	ප්‍රත්‍යාගණනය	ගැලපුම්	ඉවත් කිරීම්	2022/12/31 දිනට ශේෂය
5,734,481	පරිගණක මෘදුකාංග	6,004,481	-	-	(2,194,882)	-	3,809,599
5,734,481		**6,004,481**	**-**	**-**	**(2,194,882)**	**-**	**3,809,599**

(10.2) ක්ෂය කිරීම්

2021/01/01 දිනට ශේෂය	ක්ෂය කිරීම්	2022/01/01 දිනට ශේෂය	පූර්ව කාල සීමාවන් සඳහා ගැලපුම්	වර්ෂය සඳහා අය කිරීම්	ගැලපුම්	ඉවත් කිරීම් සඳහා ක්ෂය කිරීම්	2022/12/31 දිනට ශේෂය
5,479,471	පරිගණක මෘදුකාංග	5,791,483	-	67,500	(2,194,682)	-	3,664,301
5,479,471		**5,791,483**	**-**	**67,500**	**(2,194,682)**	**-**	**3,664,301**

ලියා හරින ලද අගය		*2022*	*2021*
5,734,481	පිරිවැය	3,809,599	6,004,481
(5,479,471)	උපචිත: ක්ෂය කිරීම්	(3,664,301)	(5,791,483)
255,010	ලියා හරින ලද අගය	**145,298**	**212,998**

		සටහන්	ශ්‍රී.ලං.ගි.පු 31/12/2022 රු.	ශ්‍රී.ලං.ගි.පු 31/12/2021 රු.	ශ්‍රී.ලං.ගි.පු 01/01/2021 රු.
(11)	**ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තුගත කර නොමැති**				
	ආශ්‍රිත සමාගම්වල ආයෝජන - DHPL		1,251,263,603	1,247,030,306	1,123,606,578
			1,251,263,603	**1,247,030,306**	**1,123,606,578**
(12)	**අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම්**				
	කොටස්වල ආයෝජන	**(12.1)**	169,297,644	25,033,150	23,104,289
	කාර්ය මණ්ඩල ණය - ජංගම නොවන	**(13.1)**	33,175,177	39,795,251	40,289,642
			202,472,821	**64,828,401**	**63,393,931**
(12.1)	**කොටස්වල ආයෝජන**				
	කොටස්වල ආයෝජන		161,449,832	161,449,831	161,449,831
	(-) හානිකරණ අගය සඳහා වෙන්කිරීම්		7,847,812	(136,416,681)	(138,345,542)
			169,297,644	**25,033,150**	**23,104,289**

කොටස් ආයෝජනවල වෙන්කිරීම් ප්‍රතිවර්ත්‍යවීම්වල විස්තර පහත දැක්වේ.

නම	2021/12/31 දිනට ඇති ඒවා මුදල	2021/12/31 දිනට වෙන් කිරීම්	2021/12/31 දිනට අගය
කළුම්බු ඩොක්යාඩ් පීඑල්සී	1,258,600		1,258,600
ලංකා කැනරීස් ලිමිටඩ්	399,600	-	399,600
ලංකා ටයිල්ස් පීඑල්සී	9,950	-	9,950
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	13,150,000	-	13,150,000
දඹදෙණිය ඊපීවී	15,000		15,000
ලුම්බිණි ඇක්චේරියා (ප්‍රයිවට්) ලිමිටඩ්	2,200,000	-	2,200,000
සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ්	8,000,000	-	8,000,000
ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ්	285,000	285,000	-
ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්	158,195	158,195	-
කැළණි වැලි කැනරීස් ලිමිටඩ්	1,200,000	1,200,000	-
අනෙකුත් කොටස්	134,773,487	134,773,487	
එකතුව	**161,449,832**	**136,416,682**	**25,033,150**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

නම	2022/12/31 දිනට හිඟ හිටි මුදල	2022/12/31 දිනට වෙන්කිරීම්	2022/12/31 දිනට අගය
කළමිබු ඩොක්යාඩ් පීඑල්සී	1,258,600	(7,337,582)	8,596,182
ලංකා කැනරීස් ලිමිටඩ්	399,600	399,600	-
ලංකා ටයිල්ස් පීඑල්සී	9,950	(393,961)	403,911
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	13,150,000	(145,489,356)	158,639,356
දඹදෙණිය ඊපීවී	15,000		15,000
ලුම්බිණි ඇක්චේරියා (ප්‍රයිවට්) ලිමිටඩ්	2,200,000	2,200,000	-
සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ්	8,000,000	8,000,000	-
ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ්	285,000	-	285,000
ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්	158,195	-	158,195
කැළණි වැලි කැනරීස් ලිමිටඩ්	1,200,000	-	1,200,000
අනෙකුත් කොටස්	134,773,487	134,773,487	
එකතුව	**161,449,832**	**(7,847,812)**	**169,297,644**

එබැවින් ආදායම් ප්‍රකාශය මත බලපෑම (රු.) **144,264,494**

නම	කොටස් ගණන	එක් කොටසක් සඳහා වෙළඳ පොළ වටිනාකම	2022/12/31 දිනය කොටස්වල
කළමිබු ඩොක්යාඩ් පීඑල්සී	145,698	59	8,596,182
ලංකා ටයිල්ස් පීඑල්සී	8,705	46	403,912
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	1,413,772	112.21	158,639,356

එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් සතු කොටස්වල අගය නිර්ණය කරගත්තේ සමාන සමාගමක් 337
336.64න් 1/3ක් පමණ තක්සේරු කිරීම සඳහා ගන්නා ලදී. 112.21

^^^ ශ්‍ර.ල.ග.ප LKAS 39 ප්‍රකාරව හානිකරණය සඳහා හඹකම් කොටස්වල සුදුකළ ආයෝජන පමණක් පරීක්ෂා කරන ලදී. කළමිබු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී කොටස් 2022.12.31 දිනටවෙළඳපොළ අගය මත මිනුම්කරණය කළ අතර එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් ඊට සමාන සමාගමක 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

		සටහන්	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.01.01 රු.
(13)	**තොග**				
	ලිපිද්‍රව්‍ය		3,225,364	2,658,056	2,857,903
			3,225,364	**2,658,056**	**2,857,903**
(14)	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු**				
	අපනයනකරුවන්ගේ ණය		38,174,012	38,805,509	40,213,509
	ඌව පරණගම අපනයන ප්‍රවර්ධන ගම්මාන - පාලන ගිණුම්		10,403,683	10,403,683	10,403,683
	(-) ණය සඳහා හානිකරණ වෙන් කිරීම්		(48,577,695)	(49,209,192)	(40,213,509)
			-	-	10,403,683
	කාර්ය මණ්ඩල ණය - ජංගම	**(14.1)**	7,607,687	9,354,812	8,337,372
	ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද		-	-	104,676,879
	අනෙකුත් ණයකරුවෝ		11,349,462	15,281,263	15,600,845
	(-) ණය හානිකරණ සඳහා වෙන් කිරීම්		(6,559,557)		
			12,397,592	**24,636,075**	**139,018,779**
(14.1)	**කාර්ය මණ්ඩල ණය (2021 වර්ෂයේ දී නැවත සඳහන් කළ වටිනාකම්)**				
	ජංගම නොවන				
	කාර්ය මණ්ඩල ණය		34,718,497	35,829,514	34,006,168
	පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (14.1.2 සටහන)		10,497,454	9,911,988	12,263,937
	අඩු කළා: කොටස් වෙළඳපොලෙන් බැහැර අනුපාතික මත පොළිය සඳහා විලම්භනය කළ සාධාරණ අගය ගැලපුම්		(12,040,774)	(5,946,251)	(5,980,463)
			33,175,177	**39,795,251**	**40,289,642**
	ජංගම				
	කාර්ය මණ්ඩල ණය		9,523,472	9,602,873	10,086,649
	පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (14.1.2 සටහන)		1,498,482	1,451,303	2,027
	අඩු කළා: කොටස් වෙළඳපොලෙන් බැහැර අනුපාතික මත පොළිය සඳහා විලම්භනය කළ		(3,414,267)	(1,699,364)	(1,751,304)
			7,607,687	**9,354,812**	**8,337,372**
(15)	**අත්තිකාරම් හා පෙර ගෙවීම්**				
	පෙර ගෙවීම්		35,409,544	17,177,100	2,261,990
	අත්තිකාරම්		2,133,092	4,716,038	2,896,919
	බැංකු ඇපකරය		-	300,000	300,000
	සේවා සඳහා තැන්පතු		1,458,325	1,695,555	1,695,555
	(-) ණය හානිකරණ සඳහා වෙන් කිරීම්		(884,949)	-	-
			38,116,012	**23,888,693**	**7,154,464**

		සටහන්	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31	ශ්‍රී.ලං.ගි.පු 2021.12.31	ශ්‍රී.ලං.ගි.පු 2021.01.01
			රු.	රු.	රු.
(16)	**මුදල් හා මුදල් සමාන දෑ**				
	ලංකා බැංකුව - මුදල් අයකැමි මත තැන්පතුව		2,500	2,500	2,500
	ලංකා බැංකුව - ලේක් විවි (ස්ථාවර තැන්පතු)		53,490,411	-	-
	ලංකා බැංකුව - ලේක් විවි (ඒක්ෂණ)		10,000,000	-	-
	ලංකා බැංකුව - ලේක්විවි (306605)		56,944,135	58,135,105	25,230,748
	ජාතික සංවර්ධන බැංකුව		363,402	5,039,745	313,562
	ලංකා බැංකුව - සංස්ථාපිත ශාඛාව		1,004,290	1,393,839	1,943,607
	DFCC බැංකුව - ආයතනික ශාඛාව		-	97,390	148,890
	ලංකා බැංකුව - ඒක්ෂණ තැන්තු		-	10,000	10,000
	සම්පත් බැංකුව - මහනුවර		100	5,759	5,561
	සම්පත් බැංකුව - ගාල්ල		1,042	7,512	7,371
	ලංකා බැංකුව - මන්නාරම		1,583	28,190	27,596
	සම්පත් බැංකුව - කුරුණෑගල		527	17,709	17,427
	අතැනි මුදල්		1,000	27,234	26,764
			121,808,990	**64,764,983**	**27,734,026**
(17)	**ලැබී ඇති හිමිතම් ආයකත්වය -**				
	භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන දායකත්වය		7,904,002	7,904,002	7,904,002
	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි දායකත්වය		2,110,282	2,110,282	2,110,282
			10,014,284	**10,014,284**	**10,014,284**
(18)	**ලැබූ ප්‍රදාන**				
	රජයේ දායකත්වය- මෝටර් වාහන		38,826,450	38,826,450	38,826,450
	රජයේ දායකත්වය - අනෙකුත්		24,979,643	22,828,743	20,491,469
	අයිටීසී දායකත්වය		12,716	12,716	12,716
	අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය		202,677	202,677	202,677
	ප්‍රදානයන් - වෙළඳ පොළ ප්‍රවේශ		939,000	939,000	939,000
	(-) රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය		(50,026,761)	(43,913,142)	(36,548,994)
			14,933,725	**18,896,444**	**23,923,318**
(19)	**වෙන් කිරීම් හා අනෙකුත් වගකීම්**				
	ඌව පරණගම අපනයන ප්‍රවර්ධන ගම්මාන		-	843,296	2,108,252
	අපනයනකරුවන්ගේ දායකත්වය		49,484,543	27,394,516	11,829,741
	නැවත ආපසු ගෙවන තැන්පතු		8,888,528	8,812,384	8,762,384
			58,373,071	**37,050,196**	**22,700,377**
(20)	**විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්**				
	ඉදිරියට ගෙන ආ ශේෂය		68,224,580	77,267,378	75,445,155
	වර්ෂය තුළ වෙන් කිරීම්		(34,000,332)	9,196,815	14,074,548
	වර්ෂය තුළ ගෙවීම්		(6,452,434)	(18,239,613)	(12,252,325)
	ඉදිරියට ගෙන ගිය ශේෂය		**27,771,814**	**68,224,580**	**77,267,378**

		සටහන	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2021.01.01 රු.
(21)	**වෙළඳ ගෙවිය යුතු**				
	ගෙවිය යුතු මුද්දර ගාස්තු		23,285	28,775	27,675
	ගෙවිය යුතුව ඇති උපයන විට ගෙවීමේ බද්ද		742	-	-
	නිමිකම් නොඉල්ල වූ විවිධ ගෙවීම්		49,740	21,093	26,080
	සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු		-	2,677,583	2,890,906
	සේවක භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු		-	321,310	346,909
	සේවකයින්ගේ අවසන් ගෙවීම්		43,997	43,997	43,997
	ගෙවිය යුතු වැටුප්		-	140,172	160,673
	ගෙවිය යුතු විගණන ගාස්තු		1,200,000	1,980,000	1,890,000
	නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු - මුදල් අයකැමි		2,500	2,500	2,500
	ටෙන්ඩර් සඳහා නැවත ආපසු ගෙවන තැන්පතු මුදල		111,000	301,000	261,000
	ඉදිරිපත් නොකළ චෙක්පත් - ණය හිමියෝ		292,133	469,134	140,477
	සේවා ගිවිසුම්වලට අදාළ හිඟ හිටි වැටුප් සඳහා වෙන් කිරීම්		6,400,487	-	-
	අනෙකුත් උපචිත වියදම්		34,156,154	42,322,367	102,740,134
	පාලන ගිණුම - ජාතික අපනයන උපාය මාර්ග		434,071	384,527	5,816,724
	පාලන ගිණුම - වෙළඳ පොළ ප්‍රවේශ වැඩසටහන		18,518,654	693,829	73,535
	පාලන ගිණුම - BSU -IT මූලාරම්භය		-	35,722	1,881,383
	පාලන ගිණුම - බෝට්ටු සකස්කිරීම වැඩිදියුණු කිරීමේ දී යටිෑ		-	-	131,535
	පාලන ගිණුම - ජාතික අපනයන සන්නාම වැඩිදියුණු කිරීම		-	18,425,480	-
	පාලන ගිණුම - කිතුල් නිෂ්පාදන වැඩිදියුණු කිරීම		517,475	966,075	-
	පාලන ගිණුම - කෝපි අපනයන ප්‍රවර්ධන ගම්මාන වැඩසටහෑ		642,213	5,849,085	-
	IP- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය පාලන ගිණුම		2,992,770	-	-
			65,385,221	**74,662,649**	**116,433,528**

(22) ශ්‍රී.ල.ගි.ප්‍ර LKAS 39 ප්‍රකාරව හානිකරණය සඳහා හිමිකම් කොටස්වල සිදුකළ ආයෝජන පරීක්ෂා කරන ලදී. කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී කොටස් 2022.12.31 දිනටවෙළඳපොළ අගය මත මිනුම්කරණය කළ අතර එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් ඊට සමාන සමාගමක 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

(23) කාර්ය මණ්ඩල ණය

අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන් සහනදායී පොලී අනුපාතික යටතේ වන ණය පහසුකම් සඳහා හිමිකම් ලබයි. ගිණුම්කරන ප්‍රමිත IFRS 9 "මූල්‍ය උපකරණ" ප්‍රකාරව එම ණය, වට්ටම්ගත කළ මුදල් ප්‍රවාහ යටතේ සාධාරණ අගයට පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත SLFRS 9 – "මූල්‍ය උපකරණ" ප්‍රකාරව කාර්ය මණ්ඩල ණය මුලින් සාධාරණ අගයට හඳුනාගන්නා අතර ඉන් අනතුරුව ඵලදායී පොලී අනුපාතිකය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ සඳහා වෙන් කිරීම් අඩුකර මිනුම්කරණය කෙරේ. මෙම ප්‍රමිතය යෙදීම වෘත්තීය වරලත් අලෙවිකරුවන් වන එදිරිසිංහ ඇන්ඩ් කම්පැනි විසින් සිදුකරනු ලැබේ.

වෙන්කළ අගය හා එහි සාධාරණ අගය අතර වෙනස පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැයක් සහ සාධාරණ අගය හානිවීමක් ලෙස සලකනු ලැබේ. ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය කරනුයේ අපේක්ෂිත සේවකයාගේ ජීව සේවා කාලය අනුවය.

සාධාරණ අගය හානිය ගණනය කරනුයේ ඵලදායී පොලී අනුපාතිකයේ අනිවාර්යෙන් පැවැතිය යුතු කොටස් වන අත්පත් කරගැනීම හා ගාස්තු හා පිරිවැය මත වන වට්ටම් කිරීමක් හෝ වාරික මුදලකි. සාධාරණ අගය හානිය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "අනෙකුත් ආදායම්" යටතේ ඇතුළත් කරගනු ලැබේ.

වට්ටම් අනුපාතිකය

අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් එකඟ වූ පරිදි කොමර්ෂල් බැංකුවේ සාමාන්‍ය හරිත ණය දීමේ අනුපාතිකය (AWLR) වට්ටම් අනුපාතිකය වශයෙන් යොදා ගන්නා අතර, එය ණය කාලසීමා අනුව වෙනස් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2022 දෙසැම්පර් 31 වන දිනට සාමාන්‍ය හරිත ණය දීමේ අනුපාතිකය 18.7% කි.

කාර්ය මණ්ඩල ණය	රු.	42,557,993
අඩුකළා : විලම්භනය වූ සාධාරණ අගය මත ගැලපුම් (සටහන 23.2)	රු.	(14,016,884)
	රු.	11,034,033
	රු.	39,575,142

සටහන (23.1) කොටස් වෙළඳපොළෙන් බැහැර අනුපාතික යටතේ වන ණය මත කල් දැමූ සාධාරණ අගය ගැලපුම්

ආරම්භක ශේෂය	රු.	7,645,615
වාර්තාකරණ දිනයට පූර්ව වර්ෂ ගැලපුම්	රු.	2,777,845
වර්ෂය තුළ ප්‍රදානය කළ ණයවලින් සාධාරණ අගය හානිය	රු.	3,593,424
අවසාන ශේෂය (අනාගත කාල සීමා සඳහා අදාළ සාධාරණ අගය හානි)	රු.	14,016,884

සටහන (23.2) පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

ආරම්භක ශේෂය	රු.	11,363,291
වර්ෂය තුළ ප්‍රදානය කළ ණය වලින් සාධාරණ අගය හානි	රු.	3,593,424
අඩු කළා :ක්‍රමක්ෂය	රු.	(3,922,682)
අවසාන ශේෂය (සටහන් කරන දිනයට ඔබ්බෙන් ක්‍රමක්ෂය කළ	රු.	11,034,033

සටහන් (23.3) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2021/01/01 දිනට ආරම්භක ශේෂය නැවත ප්‍රකාශ කිරීම (පූර්ව වර්ෂ ගැලපුම් සඳහා අතීතානුයෝගී ගැලපුම් කිරීමෙන් පසුවය)

2021 ජනවාරි 01 දිනට ශේෂය	1,138,693,881
පූර්ව වර්ෂ ගැලපුම් (සටහන 23)	
කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය	(8,187,213)
කොටස් වෙළඳපොළෙන් බැහැර අනුපාතික යටතේ වන ණය මත කල් දැමූ	12,721,409
2021 ජනවාරි 01 දිනට ශේෂය	1,143,228,077

(24) පූර්ව වර්ෂ ගැලපුම්

මූල්‍ය ප්‍රකාශවල අංග හඳුනාගැනීම හා මැනීමේ දී සිදු වූ වැරදි 2022 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. වැරදි සිදු වූ පූර්ව වර්ෂවල මූල්‍ය ප්‍රකාශන නැවත සටහන් කිරීම ප්‍රායෝගික නොවන බැවින්, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලදි ගැලපුම් නිරූපණය වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 8 හි 50 වැනි වගන්තියට අදාළ අතීතානුයෝගී යෙදීම හා අතීතානුයෝගී නැවත සටහන් ප්‍රකාරව මෙය සිදු වේ.

පූර්ව වර්ෂ දෝෂවල ස්වභාවය	බලපෑමට ලක් වූ මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමය	වටිනාකම (රු.)
පෙර වර්ෂවලට අදාළ වන 2021 වර්ෂයේ දී වාර්තා කළ වියදම්	අදාළ වියදම් ගිණුම්	1,495,994
වෙන්කරීම් (අතිරික්ත)/ (ඌන) වෙන් කිරීම්	අදාළ වියදම් ගිණුම්	253,325
පූර්ව වර්ෂවලට අදාළ ප්‍රත්‍යාවර්ත වියදම්	අදාළ වියදම් ගිණුම්	54,159
		1,803,478

(25) ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

(25.1) ආශ්‍රිත සමාගම - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු වශයෙන් සලකනු ලබන නිශ්චිත ඇතැම් ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු අතරේ දී එහි ආශ්‍රිත සමාගම් වෙත, එනම් ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම් සිදු කරනු ලැබේ. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ, හිඟ හිටි ශේෂ හා බැඳීම් ඇතුළත් පහත ගනුදෙනු එවැනි ආශ්‍රිත පාර්ශව සමග අපනයන සංර්ධන මණ්ඩලය විසින් සිදුකර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව පහත විස්තර ඉදිරිපත් කෙරේ (27 වැනි පරිච්ඡේදය).

නම	ගනුදෙනුව	2022 අගය (රු.)	2021 අගය (රු.)
ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	කුලිය	82,674,000	74,460,000
	වාහන නවතා තැබීමේ ගාස්තු	-	714,000
	විදුලිය	13,006,655	16,383,581
	ජලය	236,468	212,960
	සනීපාරක්ෂ කටයුතු	323,011	293,919
	ශ්‍රවණාගාරය කුලී		
	පදනම මත	26,375	44,460
	ණයතර ලැබීම්	40,272,190	40,272,190

(25.2) ප්‍රධාන කළමනාකරණ සේවක මණ්ඩලය

කළමනාකරණ කමිටුව පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අධ්‍යක්ෂවරුන්ගෙන් (HM කාණ්ඩය) සමන්විත අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව 2022 වර්ෂය සඳහා ඔවුන්ගේ සමහාර පාරිතෝෂිකය, ලබාගත් ණයවල විස්තර පහත සඳහන් ආකාරයෙන් ඉදිරිපත් කෙරේ.

නම හා තනතුර	සමහාර පාරිතෝෂිකය	අනෙකුත් පාරිතෝෂික	ණය විස්තර (රු.) වර්ෂය තුළ ප්‍රදානය කළ ණය	ණය විස්තර (රු.) වර්ෂය තුළ ආපසු අයකරගත් ණය	2022/12/31 දිනට හිඟ හිටි මුදල
එස්.ඩී ද මෙල් මහතා සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී	2,141,457	-	-	-	-
පී.වී.ඒ.එම්.බැද්දේගමගේ මිය වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්	2,739,127	141,851	250,000	111,111	111,111
එස්.ආර්.පී.ඉන්ද්‍රකීර්ති මහතා අත්රේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා පාලන)	2,575,725	116,339	237,270	43,140	168,965
කේ.ඒ.වී.ප්‍රේමතිලක මිය අධ්‍යක්ෂ	2,160,278	138,420	250,000	45,455	26,515
එස්.එස්.ජයවර්ධන මිය අධ්‍යක්ෂ	2,755,857	28,458	-	-	-
ඕ.එම්.සී.කුමුදිනී මිය අධ්‍යක්ෂ	2,462,285	-	250,000	45,455	71,970
එල්.වයි.ආර්.අයි.කොඩිකාර මිය අධ්‍යක්ෂ	1,668,047	110,365	-	-	-
ජේ.එස්.බදුගම මහතා අධ්‍යක්ෂ	1,717,424	-	-	-	-
කේ.ඩී.පෙරේරා මහතා අධ්‍යක්ෂ	1,802,624	-	-	-	-

(26) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

පහත දක්වා ඇති විස්තර හැරුන කොට ශේෂ පත්‍ර දිනට අසම්භාව්‍ය වත්කම් හෝ වගකීම් වෙනත් කිසිවක් නොමැත.

2022.12.31 දිනට අසම්භාව්‍ය වත්කමේ ස්වභාවය		අසම්භාව්‍ය වත්කම පැන නැගුන පාර්ශවයේ නම	විභව්‍ය/ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ	මුදල් ප්‍රවාහ ගලාඒම මිනිය නොහැකි නම්
i.	හිඟ හිට ඇති කුලී, විදුලි හා සනීපාරක්ෂක ගාස්තු නැවත ආපසු අය ගැනීම සඳහා ගොනුකර ඇති නඩුව - චෙන්නායි ට්‍රේඩ් සෙන්ටර්	ජෙම් නේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්	2,226,597	බෙරුම්කරණය සඳහා නීති ගාස්තු
		යුනික් මල්ටි ආටිස්ට්	194,143	
		සාරා ඕස් ලෙදර් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,655,000	
ii.	MASL යටතේ ලබාදී ඇති අත්තිකාරම් ගෙවීම ආපසු අයකර ගැනීම සඳහා ගොනුකර ඇති නඩව	මොනාලීසා නිෂ්පාදන	2,000,000	-
		ෆැක්ටරි ස්ටයිල් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,735,360	නීති ගාස්තු
		බෝම්බුවල රබර්	2,000,000	
iii.	ණය ගෙවීම පැහැර හැරීම	වර්ක්ස් ඔෆ් ආට්ස්	19,000	-
		රාජාස් ජුවලරි	90,418	-
		සිලොන් ඕනමෙන්ටල් සෙරමික්ස්	59,720	-
		කොකනට් හස්ක් විප්ස්	6,809	-
		සමන් පෙම්ස් ඇන්ඩ් ජුවෙලර්ස්	73,841	-
		යුනික් මල්ටි ආටිස්ට්ස්	194,143	-
iv.	බැදුම්කර නැවත ගෙවීම	ජී.එම්.ජී.ආර්.කුමාර	262,857	-
v.	අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවා ඇති හිඟ හිටි පූර්ව ගෙවීම නැවත ලබා ගැනීම සඳහා	සෝලා ග්‍රීන් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	2,303,225	-
vi.	වැටුප් ආපසු ලබාගැනීම -තනතුර අත්හැර යෑමට අදාළ සමථ මණ්ඩලය	ආර්.එම්.කේ.එස්.ප්‍රියංකර	30,479	-
		ඩබ්.එච්.සී.ඩබ්.ප්‍රනාන්දු	38,783	-
		එන්.වී.ඩී.සිහිනුවන්	38,678	-

(27) වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

නව සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම

2023 අප්‍රේල් මස 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් පත්කරන ලදී.

- 13 -

විගණකාධිපති වාර්තාව

2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } TAC/E/EDB/01/22/01 මඛේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ඔක්තෝබර් 31 දින


DF/ADG

සභාපති

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } TAC/E/EDB/01/22/01 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ඔක්තෝබර් 31 දින

සභාපති

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය	මණ්ඩලය විසින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සිදු කරන ලද ආයෝජනවල එකතුව 2022 දෙසැම්බර් 31 දිනට රු.53,490,411 විය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන අවස්ථා දෙකෙන් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව, එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, මණ්ඩලය සතු වාහන 22 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

මණ්ඩලයේ මාධ්‍ය අංශය වෙත නව වීඩියෝ කැමරාවක් සහ ඩිජිටල් SLR කැමරාවක් මිලට ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ රු.මිලියන 2.1 ක් ප්‍රතිපාදනයක් කර තිබුණු අතර, ප්‍රසම්පාදන කටයුතු 2017 මාර්තු මස ආරම්භ කර තිබුණද, අවස්ථා කීපයකදී තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙනස් කිරීම, එම කමිටු ක්‍රියාත්මක නොවීම හා ප්‍රසම්පාදන කමිටු ක්‍රමානුකූලව නොපැවැත්වීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමට වසර 05 කට වැඩි කාලයක් ගත වී තිබුණි. 2022 වර්ෂයේදී තෝරා ගත් සැපයුම්කරුට අනුව වීඩියෝ කැමරාවෙහි සහ ඩිජිටල් SLR කැමරාවෙහි වටිනාකම් එකතුව රු.4,385,500 ක් වූ අතර, ප්‍රසම්පාදන කටයුතුවල කාල පමාව හේතුවෙන් භාණ්ඩවල මිල ඉහළ යාම නිසා පවතින සීමාව තුළ මිලදී ගත හැකිවූයේ රු.2,086,700 ක් වටිනා ඩිජිටල් SLR කැමරාව පමණි.

2.3 වෙනත් කරුණු

(අ) වෙළඳ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත සංවර්ධන නිලධාරීන් 299 ක් අනුයුක්ත කර තිබුණු අතර, ඉන් 14 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට ද, 16 ක් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට ද, ඉතිරි 269 ක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ද අනුයුක්ත කර තිබුණි. ඉන් ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් 285 දෙනා විසින් ප්‍රමාණවත් රාජකාරියක් ඉටු කරනු ලබන බව විගණනයේදී අනාවරණය නොවුණි.

(ආ) මණ්ඩලය විසින් අපනයනකරුවන් සඳහා ලබා දී තිබුණු අපනයන ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන් 148 දෙනෙකු වෙතින් අයවිය යුතු මුදල රු.38,174,012 ක් විය. එම මුදලින් සියයට 97 ක් එනම්, රු.36,978,012 ක් වර්ෂ 24 ක් පැරණි ණය ශේෂ වූ අතර, එය අපනයනකරුවන් 147 කගෙන් අය විය යුතුව තිබුණි. ඉතිරි සියයට 3 ක වටිනාකම එනම්, රු.1,196,000 වර්ෂ 16 ක් පැරණි ණය ශේෂයක් වූ අතර, එය එක් අපනයනකරුවකුගෙන් අය විය යුතුව තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සමාගම් දෙකක් සඳහා රු.1,450,743 ක අපනයන ණය ලබා දී තිබුණු අතර එම සමාගම් දෙකෙහි කොටස් ආයෝජනය සඳහා රු.4,853,000 ක මුදලක් යොදවා තිබුණි. එසේ වුවද, එම සමාගම් දෙක වර්තමානය වන විට අක්‍රියව වසා දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම සමාගම් දෙකෙන් අය විය යුතු මුදලේ එකතුව රු.6,303,743 ක් විය.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් සමාගම් 29ක රු.105,117,478 ක් වූ නිදහස් කළ හැකි වරණීය කොටස්වල හා සමාගම් 34 ක රු.56,332,354 ක් වූ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 18ක කාලපරිච්ඡේදය තුළ වරණීය කොටස් සඳහා කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර, සමාගම් 14 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කරන ලද එකතුව රු. 9,183,784 ක ආයෝජිත මුදල වෙනුවෙන්ද කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

(ඉ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 487(4) ඡේදය ප්‍රකාරව සමාගම්වල කොටස්හිමිකරුවෙකු ලෙස ගත යුතු ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් මණ්ඩලය විසින් වරණීය කොටස් හා සාමාන්‍ය කොටස්වල ආයෝජිත එකතුව රු.89,469,028 ක් ආයෝජනය කරන ලද සමාගම් 28 ක නාමයන් සමාගම් රෙජිස්ටරයෙන් කපා ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඊ) මණ්ඩලය වෙත සේවා ලබා ගැනීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව ආයතන 07 ක කරන ලද තැන්පතු එකතුව රු.901,000 කට අදාල ගිවිසුම් අවසන් වී වර්ෂ 07 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණද එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන වෙනුවෙන් අත් පත්‍රිකා මුද්‍රණය කරවා ගැනීම සඳහා තෝරා ගත් සැපයුම්කරු සමඟ 2021 අප්‍රේල් 07 දිනැතිව ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව තෝරාගත් සැපයුම්කරු අපොහොසත් වූ බැවින්, රු.1,189,375 ක් වූ බදු රහිත ඇණවුම් වටිනාකමින් ගෙවන ලද අත්තිකාරම් මුදල රු.237,875 ක් හා ගිවිසුමේ 3.6 වගන්තිය ප්‍රකාරව රු.300,000 ක ඇවර කරන ලද අලාභ (Liquidated Damages) අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඌ) ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන වෙනුවෙන් ලබාදී තිබුණු රු.10,403,683ක් 2009 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ෂ 13 ක කාලයක් තුළ නැවත අයකරගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 250 ක් වුවත් තථ්‍ය කාර්ය මණ්ඩලය 176 ක් වූයෙන් තනතුරු 74 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තුළ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 ක්, මධ්‍ය කළමනාකරණ මට්ටමේ තනතුරු 17 ක් හා කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 12 ක් පැවතුණි. එම හේතුවෙන් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද වැඩ බැලීමේ පත්වීමක් විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති